# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,866 — 1969 අගෝස්තු 8 වැනි සිකුරාදා — 1969.8.8**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (II) වැනි ජේදය—පළකිරීම්

**(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු — — — | 1353 | කොටුපල් වරෙන්ද හා වෙනත් වරෙන්ද විකිණීම — — | 1392 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය — — — | 1369 | ආණ්ඩුවේ නොවන දැන්වීම — — — | 1392 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම — — — | 1371 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් — — | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම — | 1387 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම — — | 1393 |
| බඩු බාහිරාදිය විකිණීම — — — | 1388 | විවිධ දැන්වීම — — | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජීවන් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

4. අවශ්‍ය සුදුසුකම්.—

සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටු දායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(බී) 1969 අගෝස්තු මස 22 දිනට අවුරුදු 21 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(සී) ලංකා විශ්ව විද්‍යාලයේ ඇම්.බී.බී.ඇස්. උපාධිය හෝ ලංකා වෛද්‍ය මණ්ඩලය විසින් පිළිගත් ඒ හා සමාන වෛද්‍ය උපාධියක් තිබිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු. (i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දැන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 1 දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය,
තැ. පෙ. 500.

8–541—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### කාති තනතුර

අධිකරණ සේවා කොමිෂන් සභාව මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය) යටතේ දකුණු කොළඹ කාති තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවයි.

2. ඉල්ලුම් කරුවන් ලංකාවේ පුරවැසියන් වූ යහපත් චරිතයකින් හා මනා තත්ත්වයකින් යුත් වයස අවුරුදු 35 ට නොඅඩු පිරිමි මුස්ලිම්වරුන් විය යුතුය.

3. තමා පත් කරනු ලැබූ ප්‍රදේශයේ පදිංචිව සිටීමට සෑම කාතිවරයෙකුම නීතියෙන් බැඳී සිටී. මෙම තනතුරු සම්බන්ධ වූ අධිකරණ බල සීමාව යට දැක්වෙන උපලේඛනය පරිදි වේ.

4. කොළඹ අධිකරණ කොට්ඨාශයේ කොළඹ නගරයේ කොම්පඤ්ඤ වීදිය, හුනුපිටිය, වැකන්ද, කුරුඳුවත්ත, කොල්ලුපිටිය, බම්බලපිටිය, හැව්ලොක් ටවුම, තිඹිරිගස්යාය, වැල්ලවත්ත උතුර හා වැල්ලවත්ත දකුණ යන නාගරික කොට්ඨාශ වලින්ද, කෝට්ටේ පාරේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය හා රෝහල අසල යම් ස්ථානයකින් පටන්ගෙන, ප්‍රසිද්ධ පාරෙන් දකුණු පැත්තට විහිදී, බත්තරමුල්ල, තලංගම උතුර, මාලබේ, හෝකන්දර, අතුරුගිරිය, පනාගොඩ, ගොඩගම, මීගොඩ ඔස්සේ පාදුක්කෙන් අවසන් වන පරිදි පැතිරී ඇති ප්‍රදේශයන්ගෙන්ද යුක්ත වේ.

5. පත්වීමේ ලිපියේ සඳහන් කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා පමණක් තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු පත්කරනු ලැබේ.

6. මගෙන් ලබාගත යුතු විශේෂ ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලුම් පත් 1969 අගෝස්තු මස 31 වැනි දිනට පෙර මට ලැබෙන සේ එවිය යුතුය.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1969 අගෝස්තු මස 1 දා,
කොළඹ 12,
තැ. පෙ. අංකය : 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

8–542—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/3/121.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1969 සෝවියට් සමූහාණ්ඩු ශිෂ්‍යත්ව

සෝවියට් සමූහාණ්ඩුවේ උසස් අධ්‍යාපන ආයතනවල හෝ පැට්‍රිස් ලුමුම්බා මිත්‍රත්ව විශ්ව විද්‍යාලයයේ හෝ පශ්චාත් උපාධි හෝ පූර්ව උපාධි මට්ටමේ ඉගෙනීම සඳහා පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පශ්චාත් උපාධි මට්ටමේ ඉගෙනීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍ර පිළිබඳ සීමාවක් නැත. එහෙත් පූර්ව උපාධි මට්ටමේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් භාරගනු ලබන්නේ පහත සඳහන් විෂයයන් සඳහා පමණය :—

1. යන්ත්‍ර නිර්මානය.
2. බල යන්ත්‍ර නිර්මානය.
3. සිවිල් ඉංජිනේරු ශිල්පය.
4. යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය.
5. භූගර්භ විද්‍යාව.
6. ආකර ශිල්පය.

ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකියයුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය.**—පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා පහත සඳහන් අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ :—

(අ) ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින රජයේ නිලධාරීන්,

(ආ) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා එවැනි වෙනත් රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන ආයතනවල සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන්,

(ඉ) දැනටමත් ලංකාවේ හෝ විදේශයක හෝ විශ්ව විද්‍යාලයක කිසියම් පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

**සංලක්ෂ්‍යය 2.**—පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා රජයේ සේවක යන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තර ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය.

**සංලක්ෂ්‍යය 3.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්ෂ්‍යය 4.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨ මාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා අවුරුදු 2—3 ක් හෝ, පූර්ව උපාධි පාඨමාලා සම්බන්ධයෙන් අවුරුදු 5—6 ක් හෝ වන්නේ ය. පූර්ව උපාධි ශිෂ්‍ය සින් 1969. 9. 1 ට පෙර ද පශ්චාත් උපාධි ශිෂ්‍යයින් 1969. 10. 1 ට පෙරද සෝවියට් දේශයට ලඟා විය යුතුය. එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයකට හෝ ශිෂ්‍ය නිවාසයකට නොපැමිණ සිටීම ඉගෙනීමේ දියුණුවක් නො දැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකිවීම නිසා හෝ රුසියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේ වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලාංකික පුරවැසියන් විය යුතුයි.
(ii) හොඳ ඉංග්‍රීසි දැනීමක් තිබිය යුතුයි.
(iii) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා 1969. 9. 1 දිනට වයස අවුරුදු 35 ට ද, පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා 1969. 9. 1 දිනට වයස අවුරුදු 22 ට ද අඩු විය යුතුයි.
(iv) (අ) **අයදුම්කරන්නේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා නම්**—අනුගමනය කිරීමට අදහස් කරන පාඨමාලාවට උචිත විෂයයන්ගෙන් ලබාගත් පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් තිබිය යුතුයි.
(ආ) **අයදුම්කරන්නේ පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා නම්**—යටත් පිරිසෙයින් සම්මාන 5 ක් වත් ඇතුළුව අ.පො.ස. (සාමාන්‍ය) විභාගයේදී විෂයයන් 6 කින් එකම වතාව කදී සමත්වී සිටිය යුතුයි. එම සම්මාන සාමාර්ථයන් 5ට, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා (ශුද්ධ හෝ ව්‍යව හාරික හෝ උසස්) ගණිතය ද ඇතුළුවිය යුතුයි.

**සංලක්ෂ්‍යය 1.**—අ.පො.ස.(උසස් පෙළ) සුදුසුකම් හෝ පසුව ලබාගත් සම්මාන හෝ උසස් සුදුසුකම් ඇති අපෙක්ෂකයින් සම්බන්ධයෙන් පවා, ඉහත සඳහන් අවම සුදුසුකම් අනිවාර්යයෙන් ම තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය 2.—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩල යක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුව කින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපෙක්ෂකයන්, ඒ කාල සීමාඡවි සේවය සම්පූර්ණ කොට 1969. 9. 1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නො වන්නේ ය.**

**සංලක්ෂ්‍යය 3.**—එසේ ම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නො ලැබූ රජයේ සේවකයන් ද, තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමති නම් මිස, අයැදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) රුසියාවට යාම සහ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු ලංකාවට පැමිණීම සඳහා ගමන් පහසුකම්.
(ආ) නොමිලයේ ඉගැන්වීම.
(ඉ) ශිෂ්‍යත්ව දීමනාවක්.
(ඊ) නේවාසිකාගාර පහසුකම්.
(උ) නොමිලයේ වෛද්‍ය ආධාර.

**සංලක්ෂ්‍යය.**—පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීතිරීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන් 1969. 8. 20 වැනි (පෝය දින) පෙරවරු 9.00 ට මේ අමාත්‍යාංශයේ දී පැවැත් වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන් ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ආ යුතුය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් රුසියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,
(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවක යෙක් නම් ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතුය.

7. **වෛද්‍ය පරීක්ෂණ.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් රුසියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තුවන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධ යෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේද යක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාම යෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බල පැවැත් වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම් පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතා වන් සියල්ලම සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබා ගතයුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත් සම්පූර්ණ කර, කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, විදේශීය ආයතන ශාඛාව වෙත 1969.8.20 වැනි දින (පෝය දින) පෙරවරු 9.00 ට **පෞද්ගලිකව රැගෙන ආ යුතුය.** ඉන් පසුව එදිනම පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ යට ඔවුන් පෙනී සිටිය යුතුය.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම් පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් පිළිබඳව සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ නිර්දේශයන් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් පිළිබඳව ඒ ඒ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයන් ද සීල් කරන ලද කවරවල බහා පෞද්ගලිකව රැගෙන ආ යුතුය. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම්වුව ද මේ අවශ්‍යතාව සපුරා ලිය යුතුය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු 1 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

8-508—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන අමාත්‍යාංශයේ, ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය, රත්මලාන

### පරිපාලන ඕවර්සියර් තනතුර (iv වැනි පන්තිය)

පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ iv වැනි පන්තියේ පරිපාලන ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අන්දමට පිළියෙල කර 1969.8.23 දිනට හෝ ඊට පෙර 6, 7 සහ 8 ඡේදයේ නියමයන් පරිදි ලේඛණගත තැපැලෙන් මා වෙත එවිය යුතුය.

1. **වැටුප් ක්‍රමය.**—රු. 1,044—8 × 42—1380 වාර්ෂික.

2. **වයස් සීමාව.**—1969. 8. 23 දිනට වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 25 ට වැඩි නොවිය යුතුයි.

3. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :**

(අ) (i) විෂයයන් වශයෙන් ගණිතය සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ

(iii) ඊට උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

**සටහන :**

(i) භෞතික විද්‍යාවෙන් සහ හෝ යාන්ත්‍රික විද්‍යාවෙන් සමත් වී ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

(ii) හතර වැනි පන්තියේ පරිපාලන ඕවර්සියර්වරුන් වශයෙන් පත් කිරීමට පෙර අයදුම්කරුවන් විසින් ගොඩනැගිලි ඉදිකිරීම, ජලසම්පාදනය ප්‍රවාහනය, ග්‍රාම සංවර්ධනය, චැක් රෝල් ගණන් තැබීම ආදි විෂයයන් පිළිබඳව උපදේශයන් ඇතුලත් කර දෙපාර්තමේන්තුව මගින් විශේෂයෙන් සංවිධානය කරන මාස 12 ක පාඨමාලාවක් සතුටුදායක ලෙස ලෙස සම්පූර්ණ කල යුතුය.

**හෝ**

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික ප්‍ත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ

(iii) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී, ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වනු ලබන පහත සඳහන් පාඨමාලාවන්ගෙන් එකක් සමත් වී සිටීම.

(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරින්ගේ පාඨමාලාව (වසර දෙක).

(ආ) මිණුම්දෝරුවන්ගේ හා මට්ටම්කරුවන්ගේ පාඨමාලාව (වසර එකයි)

(ඇ) නාගරික ඉංජිනේරු ශිල්පය, නිර්මාණ ඉංජිනේරු ශිල්පය හෝ ගොඩනැගිලි තැනීම පිළිබඳ අර්ධකාලීන පාඨමාලාව.

**හෝ**

(ඇ) ඉහත සඳහන් 1, 2, 3 ඡේදයන් අඩංගු පාඨමාලාවට සමාන හෝ ඊට වඩා උසස් යයි ජලසම්පාදන, ජලාපවහන - හා පළාත් පාලන වැඩ අංශයේ, අධ්‍යක්ෂ විසින් සලකනු ලබන කාර්මික විද්‍යාව පිළිබඳ ආයතනයක හෝ විද්‍යාලයක් මගින් පවත් වන ලද පාඨමාලාවකින් සමත් විය යුතුය.

4. **සේවයට බඳවා ගන්නා කොන්දේසි :**

(i) තනතුරු තාවකාලිකය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මුල් අවස්ථාවේ එක් අවුරුදු පරීක්ෂණ කාල පරිච්ඡේදයකට යටත්ව තබනු ඇත.

(ii) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයට දායක විය යුතුය.

5. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර නියමිත දිනයට පසුව මෙහි ලැබුණහොත් එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් එම ඉල්ලුම්පත් භාරගන්නා ලෙස නිර්දේශ කළහොත් මිස ඒවා සළකා බලනු නොලැබේ.

නිලධාරියා තෝරාගනු ලැබුවහොත් ඔවුනු මුදා හරිනවාද යන වග ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන විට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැළකිය යුතුයි : බවුතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන සහතික පත්‍ර.

(ඇ) චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයට මෙය අදාල නොවේ.)

(ඈ) සිංහල/දෙමළ පිළිබඳව ලබාගත් උසස්ම සහතිකය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනිත් ලියකියවිලි සියල්ලක්ම "වැඩ බලන අධ්‍යක්ෂ, පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදන, ජලාපවහන හා පලාත් පාලන වැඩ අංශය, රත්මලාන." යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

පළාත් පාලන අමාත්‍යාංශය,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන, 1969. 7. 24.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය පළාත් පාලන අමාත්‍යාංශය**

**පරිපාලන ඕවර්සියර් තනතුර (iv වැනි පන්තිය)**

1. ඉල්ලුම්කරුගේ නම (පැහැදිලි අකුරෙන්) :—
   (අ) මුල් නම :————.
   (ආ) වෙනත් නම් :————.

2. ලිපිනය (පැහැදිලි අකුරෙන්) :

3. උපන් දිනය :————.
   1969. 8. 23 දිනට වයස :——, අවු. :——, මාස :——, දවස් :——.

4. පුරවැසි භාවය හා එය ලබාගත් අන්දම :—
   (අ) පරම්පරාවෙන්ද :————.
   (ආ) ලියා පදිංචි කිරීමෙන්ද :————.

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
   (ඈ) අයදුම්කරුගේ පියා පස මී මුත්තා :————.

6. අයදුම්කරුගේ සිවිල් තත්වය (විවාහක/අවිවාහක) :————.

7. අධ්‍යාපන සුදුසුකම් (සමත් වී ඇති උසස්ම විභාගය සඳහන් කරන්න.) :————.

8. ලබාගත් වෘත්තීය හා කාර්මික සුදුසුකම් (දිනය සඳහන් කරන්න) :————.

9. පාඨශාලාව/විද්‍යාලය හැර යැමෙන් පසු නියුක්තවී සිටි රැකියාවල් (දිනය සඳහන් කරන්න.) :————.

10. පරිපාලන ඕවර්සියර් කෙනෙකු ලෙස පළපුරුද්ද :————.

11. සිංහල පිළිබඳව සමත් ඉහළම විභාගය :————.

12. අයදුම්කරු පිළිබඳව තොරතුරු සොයා දැනගත හැකි 3 දෙනෙකුගේ නම හා තනතුරු නාම (දැනට රජයේ සේවයේ සිටින අයට මෙය අදාල නොවේ) :————.

13. දැන්වීමේ 3 වන ඡේදයේ කුමන උප ඡේදයන් යටතේ සුදුසුකම් ලබා තිබේ ද ? :————.

14. වෙනත් කරුණු :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති විස්තර නිවැරදි බවත්, සත්‍ය බවත්, මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත්, එසේ ඔප්පු වූයේ මා තනතුරට තෝරා ගැනීමට ප්‍රථමයෙන් නම් ඒ හේතුකොට ගෙන මා නුසුදුස්සෙකු වන බවත් තෝරා ගැනීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දමනු ලැබීමට හේතු වන බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–333—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ලංකා උසස් කාර්මික විද්‍යායතනය

**ඔටෝමොබයිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II ශ්‍රේණියේ උපදේශක තනතුර**

මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ඔටෝමොබයිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙලවූ අයදුම් පත් 1969.8.28 දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකුම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(i) 1969.8.28 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු අවුරුදු 40 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදල නොවේ);

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බව;

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව; සහ,

(iv) (අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ (විදුලි සහ යාන්ත්‍රික) සහතිකය හෝ

(ආ) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා සහතිකය හෝ

(ඇ) සමාන හෝ උසස් සුදුසුකම්; සහ

(v) සිංහලෙන්/දෙමළෙන් ඉගැන්වීමේ හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීම ලැබී අවුරුදු 3 ක් ඇතුලත සිංහලෙන්/දෙමළෙන් ඉගැන්වීමේ හැකියාවක් ලබාගත යුතුය;

(vi) අවුරුදු 5 ක ප්‍රායෝගික හා/හෝ ඉගැන්වීමේ පළපුරුද්ද.

4. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4, 180 × 8—රු. 5,340 වේ. (රු. 4,080 හා රු. 4,800 වාර්ෂික වැටුප ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම්).

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත් වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත්කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික;

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්.

**සැළකිය යුතුය.**—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදල ලියකියවිලි මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුනු කල පිළිතුරක් නොලදහොත් වහාම ඒ බව ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

එල්. එච්. සුමනදස,
අධ්‍යක්ෂ,
ලංකා උසස් කාර්මික විද්‍යායතනය.

1969 ක්වූ ජූලි මස 31 දින,
මොරටුව,
කටුබැද්දේ,
ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ දීය.

## ඉල්ලුම් පත්‍රය

**ඔටෝමොබයිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ II ශ්‍රේණියේ උපදේශක තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :————.
2. තැපැල් ලිපිනය (ලිපිනය වෙනස්වූ වහාම ඒ බව දන්වා එවිය යුතුය) :————.
3. ජාතිය (ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදසුම් අංකයත් සඳහන් කරන්න) :————.
4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු :———, මාස :———, දින :———.

   (ආ) උපන් දිනය : අවුරුද්ද :————, මාසය :———— දිනය : ————.

   (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)
5. උපන් ස්ථානය : (අ) අයදුම්කරු :————, (ආ) ඔහුගේ/ඇගේ පියා :————, (ඇ) අයදුම්කරුගේ සීයා :————, (ඈ) අයදුම් කරුගේ සීයාගේ පියා :————.
6. (අ) විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

   (ආ) විවාහක නම්, (i) විවාහ වූ දිනය :————, (ii) ළමයි ගණන :————.
7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| (1) | | | | | |
| (2) | | | | | |
| (3) | | | | | |
| (4) | | | | | |

   (ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයත් සමග :—

   (අ) සිංහල :————.

   (ආ) ඉංග්‍රීසි :————.

   (ඇ) දෙමළ :————.
9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම්ද සඳහන් කරන්න :————.
10. කියවීම, ලිවීම, කථාකිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේද ?

    (අ) සිංහල :————.

    (ආ) ඉංග්‍රීසි :————.

    (ඇ) දෙමළ :————.
11. විශේෂ සුදුසුකම් (නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානුව සහිතව සඳහන් කරන්න) :————.
12. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය, හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
13. මුදල් කරදරවලින් නිදහස්ද ? නොඑසේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද :————.
14. වෙනත් විස්තර (වෙනත් විශෙෂ හිමිකම් ආදිය) :————.
15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුයි: දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් මේ අවශ්‍ය නැත) :————.
16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—

    (i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටි දින වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—

(i) (අ) තනතුර, ශ්‍රෙණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.

(ii) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම්ද ? :————.

(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iv) මීලඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–497—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී (රස ප්‍රදර්ශණය) තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී (රස ප්‍රදර්ශණය) තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 අගෝස්තු මස 23 දිනට පෙර, "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කෝට්ටේ පාර, කොළඹ 8" යන මගේ රාජකාරී ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය : වර්ෂයකට රු. 3,180—120×6, 8 180×6 සහ 240×6—රු. 6,780 කි. වර්ෂයකට රු. 4,080, රු. 4,800 සහ රු. 5,580 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

**කාර්යක්ෂමතා කඩඉම් :—**

(i) සේවයේ ස්ථිර කිරීමට ප්‍රථම දෙපාර්තමේන්තු නීතිරීති, මුදල් රෙගුලාසි, පාලන රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග හා ආරෝග්‍යශාලා පරිපාලනය සම්බන්ධව පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ii) වර්ෂයකට රුපියල් 4,080 න් ඔබ්බට යාමට ප්‍රථම වූ කාර්යක්ෂමතා කඩඉම සඳහා දෙවෙනි භාෂාව පිළිබඳ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(iii) වර්ෂයකට රුපියල් 4,800 න් ඔබ්බට යාමට පෙර වූ කාර්යක්ෂමතා කඩඉම් සඳහා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ පහත සඳහන් ඕනෑම විෂයයන් දෙකකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයේ විෂයයන් ආයුර්වේද කොමසාරිස්තුමා විසින් නිගමනය කරනු ලැබේ :—

(1) රෝග නිවාරණය සහ සනීපාරක්ෂාව (ආයුර්වේද)

(2) පංචකර්ම චිකිත්සා

(3) පෝෂ්‍යදායී ආහාර

(4) කුමාර චිකිත්සා

(5) නාඩි ඥානය

(6) දන්ත විද්‍යාව

(7) මානසික රෝග ආදිය.

(iv) රු. 5,580 න් ඔබ්බට යාමට පෙර පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මුලික පර්යේෂණ හෝ ආයුර්වේදය පිළිබඳ නොයෙකුත් ප්‍රකාශන පළ කිරීමෙන් ලත් කීර්තිය යනාදියෙන් සමත්වීම කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නො ලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—**

(i) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ii) 1969 අගෝස්තු මස 23 දිනට වයස අවුරුදු 23 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

(iii) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකයක් ලබා, ආයුර්වේද ආරෝග්‍යශාලාවක වර්ෂයක ප්‍රායෝගික පුහුණුව ලබා තිබීම හෝ අවුරුදු 5 කට නොඅඩු පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**හෝ**

සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු විය යුතුය.

(iv) ආයුර්වේද රස ඖෂධ වර්ග නිෂ්පාදනය පිළිබඳව ප්‍රායෝගික දැනුමක් හා පළපුරුද්දක් හා ඖෂධ වර්ග හඳුනා ගැනීම සම්බන්ධව ප්‍රායෝගික දැනුමක් තිබිය යුතු අතර, ඒ පිළිබඳ දේශණ පැවැත්වීමේ හැකියාවක් තිබිය යුතුය.

5. අයදුම්කරුවන් පහත සඳහන් සහතික පිටපත් ඔවුන්ගේ අයදුම් පත්වලට ඇමිණිය යුතුය (මුල් පිටපත් නොවේ) :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නො ලැබේ.) ;

(ආ) ලබාගත් උසස්ම වෘත්තීය හා ශාස්ත්‍රීය සහතික පත්‍ර ;

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක් (රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර උවමනා නොකෙරේ.)

**සැලකිය යුතුය :**—අයදුම්පත් සමඟ අමුණා එවන කිසිම ලියවිල්ලක් හෝ සහතික පිටපතක් ආපසු එවනු නො ලැබේ.

6. මෙම තනතුරට පත්වන අයදුම්කරු තම රාජකාරීන්ට අමතරව, සතියකට නියම කෙරෙන පැය ගණනක් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ ශිෂ්‍යශිෂ්‍යාවන්ට රස බෙහෙත් පිළියෙල කිරීම හා රස ප්‍රදර්ශණය පිළිබඳ දේශණ පැවැත්විය යුතුය.

7. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ වන පොදු කොන්දේසි මෙම තනතුරු කෙරෙහිද බලපානු ලැබේ. එකී කොන්දේසි බලන්න.

විමල් නවගමුව,
ආයුර්වේද කොමසාරිස්

1969 ජූලි 30 දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

## ආදර්ශ ඉල්ලුම්පත

### සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී (රස ප්‍රදර්ශණය) තනතුර—ආයුර්වේද දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම :—

(අ) පෙළපත් නාමය :————.

(ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

1969 අගෝස්තු මස 23 දිනට වයස :— අවු :————, මාස :————, දින :————.

4. ලාංකිකයෙක්ද නැද්ද යන බව :————.

ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද, නැතහොත් ලියාපදිංචිවීමෙන්ද යන බව :————.

5 ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

6. ඩිප්ලෝමා ලැබූ වෛද්‍යවරයෙක් නම් :—
ලබා ඇති වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය)
(i) ලබා ඇති ඩිප්ලෝමාව :————.
(ii) එය ලැබූ වර්ෂය .————.
(iii) ලබා ඇති පන්තිය :————.
(iv) ලැබූ ආයතනය ————.

7. ලියාපදිංචි වෛද්‍යවරයෙක් නම් ලියාපදිංචි අංකය හා වර්ෂය : ————.

8. රස ඖෂධ වර්ග නිෂ්පාදනය පිළිබඳ පළපුරුද්ද :————.

9. පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

10. මෙතෙක් යම් රජයේ තනතුරක් දැරුවේ නම් එම තනතුරු හා පත්වූ දින, අස්වූ දින හා අස්වීමට හේතුව :————.

11. වෙනත් කරුණු :————.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව තෝරාගැනීමට පෙර දැන ගන්නට ලැබුණොත්, මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මෙයින් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–436/1—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 අගෝස්තු මස 23 දිනට පෙර, "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, කෝට්ටේ පාර, කොළඹ 8" යන මගේ රාජකාරී ලිපිනයට ලැබෙන්න සැලැස්විය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේ ය : වර්ෂයකට රු. 3,180—120×6, 180×8 සහ 240×6—රු. 6,780 කි. වර්ෂයකට රු. 4,080, රු. 4,800 සහ රු. 5,580 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

**කාර්යක්ෂමතා කඩඉම් :—**

(i) සේවයේ ස්ථිර කිරීමට ප්‍රථම දෙපාර්තමේන්තු නීතිරීති, මුදල් රෙගුලාසි, පාලන රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග හා ආරෝග්‍යශාලා පරිපාලනය සම්බන්ධව පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ii) වර්ෂයකට රුපියල් 4,080 න් ඔබ්බට යාමට ප්‍රථම වූ කාර්යක්ෂමතා කඩඉම සඳහා දෙවෙනි භාෂාව පිළිබඳ දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(iii) වර්ෂයකට රුපියල් 4,800 න් ඔබ්බට යාමට පෙර වූ කාර්යක්ෂමතා කඩඉම් සඳහා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ පහත සඳහන් ඕනෑම විෂයයන් දෙකකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයේ විෂයයන් ආයුර්වේද කොමසාරිස්තුමා විසින් නිගමනය කරනු ලැබේ :—
(1) රෝග නිවාරණය සහ සනීපාරක්ෂාව (ආයුර්වේද)
(2) පංචකර්ම චිකිත්සා
(3) පෝෂ්‍යදායී ආහාර
(4) කුමාර චිකිත්සා
(5) නාඩි ඥානය
(6) දන්ත විද්‍යාව
(7) මානසික රෝග ආදිය.

(iv) රු. 5,580 න් ඔබ්බට යාමට පෙර පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මූලික පර්යේෂණ හෝ ආයුර්වේදය පිළිබඳ නොයෙකුත් ප්‍රකාශන පළ කිරීමෙන් ලත් කීර්තිය යනාදියෙන් සමන්විත කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නො ලැබේ.

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :—**

(i) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ii) 1969 අගෝස්තු මස 23 දිනට වයස අවුරුදු 23 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

(iii) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකයක් ලබා, ආයුර්වේද ආරෝග්‍යශාලාවක වර්ෂයක ප්‍රායෝගික පුහුණුව ලබා තිබීම හෝ අවුරුදු 5 කට නොඅඩු පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

**හෝ**

සාමාන්‍ය ආයුර්වේද වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් ඇති ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු විය යුතුය.

5. අයදුම්කරුවන් පහත සඳහන් සහතික පිටපත් ඔවුන්ගේ අයදුම් පත්වලට ඇමිණිය යුතුය (මුල් පිටපත් නොවේ) :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නො ලැබේ.) ;

(ආ) ලබාගත් උසස්ම වෘත්තීය හා ශාස්ත්‍රීය සහතික පත්‍ර ;

(ඇ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක් (රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර උවමනා නොකෙරේ.)

**සැලකිය යුතුය :**—අයදුම්පත් සමඟ අමුණා එවන කිසිම ලියවිල්ලක් හෝ සහතික පිටපතක් ආපසු එවනු නො ලැබේ.

6. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ රාජ්‍ය සේවා තනතුරුවලට අදාළ වන පොදු කොන්දේසි මෙම තනතුරු කෙරෙහිද බලපානු ලැබේ. එකී කොන්දේසි බලන්න.

විමල් නවගමුව,
ආයුර්වේද කොමසාරිස්.

1969 ජූලි 30 දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

### ආදර්ශ ඉල්ලුම්පත

**සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු—ආයුර්වේද දෙපාර්තමේන්තුව**

1. සම්පූර්ණ නම :—
(අ) පෙළපත් නාමය :————.
(ආ) අනික් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.
1969 අගෝස්තු මස 23 දිනට වයස :— අවු :————, මාස :————, දින :————.

4. ලාංකිකයෙක්ද නැද්ද යන බව :————.
ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන්ද, නැතහොත් ලියාපදිංචිවීමෙන්ද යන බව :————.

5. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

6. ඩිප්ලෝමා ලැබූ වෛද්‍යවරයෙක් නම් :————.

ලබා ඇති වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය)

(i) ලබාඇති ඩිප්ලෝමාව :————.

(ii) එය ලැබූ වර්ෂය :————

(iii) ලබා ඇති පන්තිය :————.

(iv) ලැබූ ආයතනය :————.

7. ලියාපදිංචි වෛද්‍යවරයෙක් නම් ලියාපදිංචි අංකය හා වර්ෂය :

8. පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි පළපුරුද්ද (සහතික පිටපත් ඇමිණිය යුතුය) :————.

9. මෙතෙක් යම් රජයේ තනතුරක් දැරුවේ නම් එම තනතුරු හා පත්වූ දින, අස්වූ දින හා අස්වීමට හේතුව :————.

10. වෙනත් කරුණු :————.

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සැබෑ බවද, නිවැරදි බවද, මෙයින් සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති තොරතුරු යම් හෙයකින් අසත්‍ය බව තෝරාගැනීමට පෙර දැන ගන්නට ලැබුණොත්, මා පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවද, පත්වීමට පසු දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහ කරනු ලබන බවද මෙයින් දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–436/2—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### සැලසුම්කරු තනතුරු—II වන ශ්‍රේණිය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ II වෙනි ශ්‍රේණියේ සැලසුම් කරු තනතුරු 3 ක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක් වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කරගත් අයදුම්පත් 1969 අගෝස්තු මස 25 දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙනසේ එවිය යුතුය.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය : රු. 1,260 න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින්වූ වැටුප් වර්ධක 21 කින් රු. 3,780 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මෙම තනතුරට හිමිය. රු. 2,820 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතවේ. පත්වීම අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) මනා චරිතයකින් හා ශාරීරික සනීපයකින් යුක්ත බව.

(ආ) ඉල්ලුම්කරුවන් 1969 අගෝස්තු 25 දිනට වයසින් අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව, (රජයේ සේවයේ නියුක්ත වූවන් සඳහා මෙම වයස් සීමාව බල පාන්නේ නැත.)

(ඇ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් මූලික ගණිතය විෂයයක් සහිතව සාමාර්ථය ලබා සිටීම සහ ඊට අතිරේකව පහත දැක්වෙන සුදුසුකම් වලින් එකක් තිබීම:—

(ii) (1) ලංකා කාර්මික විද්‍යාලයේ ආධුනික සැලසුම්කරුවන් සඳහා වූ එක් අවුරුදු සම්පූර්ණ කාල ප්‍රාථමික පාඨමාලාව හා වර්ෂ දෙකක පුහුණුවක් ද සතුටු දායක ලෙස නිමාවට පත් කොට තිබීම,

හෝ

(2) ලංකා කාර්මික විද්‍යාලයේ සුළු සේවක පරිපාලන පාඨමාලාව හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කොට එක් අවුරුදු පුහුණුවක් ද ලබා තිබීම,

හෝ

(3) සැලකිය යුතු ඉංජිනේරු සමාගමක් සමඟ හෝ වරලත් ඉංජිනේරු වරුන්ගේ ගෘහනිර්මාන ශිල්පීන් යටතේ වර්ෂ හතරක පුහුණුවක් ලබා ගෙන හා ලංකා කාර්මික විද්‍යාලයේ නා නා ශ්‍රේණිවල තුන් අවුරුද්දක සන්ධ්‍යා පන්ති අනු ගමනය කොට තිබීම (මෙම සුදුසුකම් ලැබූ අයදුම් කරුවෙකු පඩි ක්‍රමයේ රු. 1,620 ට නොවැඩි වාර්ෂික වේතන අංකයක තැබීමට සලකා බලනු ලැබේ.)

හෝ

(4) ලංකා කාර්මික විද්‍යාලයේ "ගොඩනැගිලි ඉදිකිරීමේ 2 වන පියවර විභාගයෙන්" 1947 ට පෙර සමත් විය යුතු අතර, සැලකිය යුතු වාණිජ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු 2 කට වැඩි කාලයක් සැලසුම්කරුවකු ලෙස සේවය කොට තිබීම,

හෝ

(5) සැලකිය යුතු ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ සැලසුම්කරුවෙකු ලෙස වර්ෂ 5 ක් සේවය කොට තිබීම.

5. අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපතක් (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතිකපත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතිකපත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික—කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) ළඟදී ලබාගත් චරිත පිළිබඳ සහතිකපත් 3 ක්.

6. රජයේ ගැසට් පත්‍රයේ 1 වන කොටසේ (II) වන ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි අයදුම් කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුය.

පී. ර. හ. පෙරේරා,
වැඩ බලන වන සංරක්ෂක.

අයදුම්පත් එවිය යුතු ලිපිනය :—
වන සංරක්ෂක,
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 509,
කොළඹ 2,
1969 ජූලි 30 දින.

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ—II වෙනි ශ්‍රේණියේ සැලසුම් කරුවන්ගේ තනතුරු සඳහා වූ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය සහ ස්ථානය :————.

4. ජාතිය :————.

5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.

6. දැනට රක්ෂාවක් නොකරයි නම් අන්තිම වරට කළ රක්ෂාව :————.

7. අධ්‍යාපනික සුදුසුකම් :————.

8. කාර්මික සුදුසුකම් (සමර්ථවූ විභාග සඳහන් කරන්න) :————.

9. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.

10. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර (දින සහිතව) :————.

11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස්වීමට හේතුව :————.

12. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත්නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–464—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාව

### සහකාර ගණකාධිකාරී තනතුර

සංස්ථා සේවයේ සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ලාංකික යන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

(අ) වැටුප් ක්‍රමය.—මසකට රු. 600—40—රු. 1,000 (සියළු දීමනා සහිතව)

(ආ) වයස් සීමාව.—1969.8.21 දිනට වයස අවුරුදු 40කට නො වැඩි විය යුතුයි.

(ඇ) සුදුසුකම්.—(i) පරම්පරාවෙන් හෝ ලියා පදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ii) හොඳ කල් ක්‍රියාවෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

(iii) වරලත් ගණකාධිකාරීවරුන්ගේ (ලංකා) මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වී තිබීම හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකාරී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංයුක්ත මණ්ඩලයක යටතේ පිරිසෙයින් අවුරුදු 3කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඈ) සේවා කොන්දේසි.—(i) තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පනවා ඇති නීති රීති හා ව්‍යවස්ථාවලට අනුකූලව එකඟව කටයුතු කිරීමට යටත් විය යුතුයි.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, හෙතෙම අවුරුදු 2ක ආධුනික කාල සීමාවකට යටත් වනු ඇත.

(iii) තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදලට දායක විය යුතුයි.

පහත සඳහන් ආකෘති පත්‍රයේ සඳහන් අයුරින් සකස් කරන ලද අයදුම්පත් 1969.8.21 දිනට හෝ ඊට ප්‍රථම කොළඹ 1, චෛත්‍ය පාරේ, 21 වැනි ස්ථානයේ, වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

රාජ්‍ය සේවයේ හෝ සංයුක්ත මණ්ඩලයක සිටින නිලධාරීන් ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානියා මගිනි. නිලධාරියා තෝරාගනු ලැබුවහොත් සිය සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුයි.

අයදුම්කරුවන් සිය අයදුම්පත් සමග පහත සඳහන් ලිය කියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(1) උප්පැන්නය ලියා පදිංචි කළ සහතිකය.

(2) ලබාගත් ඉහලම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(3) කලින් සේවය කළ ආයතන ප්‍රධානීන්ගේ සහතිකය හා එහිදී ඉටු කරන ලද වැඩ හඳුන්වන සහතිකය.

(4) චරිතය හා තනතුර සඳහා සුදුසුකම් ඇත් බවට ළඟදී ලබා ඇති චරිත සහතික දෙකක්.

සාමාන්‍යාධිකාරී.

වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාව,
21, චෛත්‍ය පාර,
කොළඹ 1.
1969 ජූලි මස 25 වෙනි දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

..................................තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනිකුත් නම් :————.
2. ලිපිනය :————.
3. ජාතිය පරම්පරාවෙන් ද නැතහොත් ලියා පදිංචිවීමෙන් ද යන වග :————.
4. අයදුම්කරු උපන් දිනය හා ස්ථානය :————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
5. 1969.8.21 දිනට වයස :————.
6. විවාහක/අවිවාහක බව :————.
7. ලබා ඇති ඉහලම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :————. (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
8. සිංහල සහ/හෝ දෙමළ පිළිබඳ දැනුම :————.
9. දැනට කරණ රැකියාව පිළිබඳ විස්තර :————.
10. කලින් කරන ලද රැකියාව පිළිබඳ විස්තර :————.
11. වෙනත් විස්තර :————.
12. අයදුම්කරුගේ චරිතය පිළිබඳව සහතික කළහැකි දෙදෙනෙකුගේ නම් :—
    1...............................................
    2...............................................

මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සැබෑ නිවැරදි ඒවා බවත් මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා පත් කර ගැනීමට පළමුව අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට ඉඩ ඇති බවත් තෝරා පත් කර ගැනීමෙන් පසුව ඒ බව දැනගැනීමට ලැබුනහොත් කිසිම වන්දියක් නොමැතිව මා තනතුරෙන් පහ කරනු ලැබීමට ඉඩ ඇති බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-417—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### දෙවන පන්තියේ බොයිලේරු සාදන්නන්ගේ තනතුරු
### යාන්ත්‍රික ඉංජිනේරු අංශය

කොළඹ වරාය කොමිෂන් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ පුරප්පාඩු වී තිබෙන ඉහත සඳහන් තනතුරු උදෙසා අයදුම් පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් පත් පහත සඳහන් වන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කර, "වරාය කොමසාරිස්, ඉංජිනේරු අංශය, වරාය කොමිෂන් සභාව, කොළඹ 1" යනුවෙන් අමතා 1969. 8. 25 වැනි දින ප. ව. 4.30 ට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන ලෙස එවිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—පළමු හය මස තුල දිනකට රු. 2.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 750—42×13—1296 යි. රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

3. තෝරාගනු ලබන අපේක්ෂකයින් සමසක සේවා කාලයකින් පසුව මාසික වැටුප් ක්‍රමයට මාරු කරනු ලැබේ. එවිට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකත්වය හිමිවේ.

4. සුදුසුකම් :—

(i) වයස අවුරුදු 21 ට වැඩිවිය යුතුයි.

(ii) කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.

(iii) පිළිගත් ආයතනයක දෙවන පන්තියේ බොයිලේරු සාදන්නෙකු වශයෙන් අවුරුදු 5 කට නො අඩු කාලයක් සේවය කර ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතුයි.

(iv) අඟලෙන් 1/32" දක්වා පරිමාණයන් කියවීමට හැකියාව තිබිය යුතුයි.

(v) තමාගේ වැඩට අවශ්‍යවන සෑම ආයුධයකම නම් සහ ඒවා දක්ෂ ලෙස පාවිච්චි කිරීමට හැකියාව තිබිය යුතුයි.

(vi) බොයිලේරුවල ඇති නොයෙක් වර්ගයේ ටියුබ්, ස්ටේ ඇණ සහ රිවට් ඇණ ගැන දැනුමක් තිබිය යුතුයි.

(vii) බොයිලේරුවක තිබෙන සෑම කොටසකම ඇති වැදගත්කම දත යුතුයි.

(viii) වානේ බත්තල්, බෝට්ටු සහ නැව් අළුත් වැඩියා කිරීමේ පළපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

5. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ ඉල්ලුම් පත්‍රයට පහත දැක්වෙන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ළඟදී ලබාගත් චරිත සහතිකයක්.

(ඇ) 4 වන ඡේදයේ iii සිට (viii) දක්වා විස්තර කරන ලද පළපුරුදුකම් පිළිබඳ සහතික.

6. අවශ්‍ය වුවහොත් කෙටි දැන්වීමකින්, පිට පළාත්වල වැඩට යැමට සාමාන්‍යයෙන් වැඩ කරන වේලාවෙන් පිටස්තර වැඩ කිරීමට සහ මුරෙන් මුර වැඩ කිරීමට සූදානම්ව සිටිය යුතුයි.

7. ඉල්ලුම් පත්‍ර හෝ මෙම තනතුරු සම්බන්ධයෙන් එවන සෑම ලිපියක්ම, කරන සෑම විමසීමක්ම, ඉදිරිපත් කළ යුත්තේ, "වරාය

කොමසාරිස්, ඉංජිනේරු අංශය," කියා මිස මෙම දෙපාතීමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවන බව සැලකිය යුතුයි.

8. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම් පත් ලැබුණු බවද දන්වනු නොලැබේ.

9. මෙම අවශ්‍යතාවයනට අදාල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුයි.

එල්. එස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1969. 7. 30 දින.

### ආකෘති පත්‍රය

**දෙවන පන්තියේ බොයිලේරු සාදන්නන්ගේ තනතුරු—යාන්ත්‍රික ඉංජිනේරු අංශය—වරාය කොමිෂන් සභාව**

1. සම්පූර්ණ නම :————.
2. පෞද්ගලික ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
4. පලපුරුදුකම් පිළිබඳ විස්තර :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි).
5. වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–439—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කළුතර දිස්ත්‍රික්කයේ මීගහතැන්න කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර පස්දුන් කෝරළය කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

මීගහතැන්න උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායඝීලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කායඝීල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඝීල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඝීලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

සියලුම ඉල්ලුම්පත් මෙම කායඝීලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල විය යුතු අතර, ඒවා 1969 සැප්තැම්බර් මස 15 දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලීල් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 ජූලි මස 31 වෙනි දින දී,
කළුතර, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

8–487—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### යාන්ත්‍රික ෆෝර්මන් තනතුර

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ෆෝර්මන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළිවෙල කරගත් අයදුම්පත් 1969 සැප්තැම්බර් 5 වැනි දිනට හෝ ඊට පෙර සර්වේ ජනරාල් (ආයතන අංශය) වෙත ලැබෙන පරිදි එවිය යුතු ය.

2. **බඳවා ගැනීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—

(අ) මෙම තනතුර ස්ථිරය. නමුත් විශ්‍රාම වැටුප් රහිත ය. නිලධාරියාගේ වැටුපෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. (තනතුර විශ්‍රාම වැටුප් සහිත වූවක් කිරීමට කටයුතු කර ගෙන යනු ලැබේ. එවිට වැන්දඹු හා අනත් දරු විශ්‍රාම අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ.)

(ආ) මෙම පත්කිරීම අවුරුදු තුනක් හා තනතුර ස්ථිර කළ බවට ලියවිල්ලක් නිකුත් කරනු ලබන තෙක් ආධුනික සේවා කාලයකට යටත් වේ.

රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් නියමිත කාලසීමාවකට වැඩ බලන පදනමක් මත පත් කරනු ලැබේ

තනතුර ස්ථිර කරනු ලැබීම, රජය මගින් ඔහුට මෙරට හා පිටරට පිළියෙල කරනු ලබන ඕනෑම පාඨමාලාවක් සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීම, අදාල පරිදි ආධුනික සේවා කාලය හෝ වැඩ බලන කාලසීමාව ඇතුලතදී සතුටුදායක සේවය හා හැසිරීම හා අංක 701 හා 66.9.4 දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව නියමිත සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත්වීම මත රඳාපවතී.

(ඇ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා පහත සඳහන් අවශ්‍යතාවයන් ගෙන් යුක්ත විය යුතුය :—

(i) දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික යෝග්‍යතාවයෙන් යුක්ත බව, මනා ඇස් පෙනීම, සාමාන්‍ය වර්ණ දෘෂ්ටිය හා ත්‍රිමානක දර්ශනය දැනගැනීමට පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණය කින් හා කැඳවූ විටකදී ඕනෑම විදේශීය රටකදී පුහුණුවීමේ පාඨමාලාවක් අනුගමනය කිරීමට ශාරීරික යෝග්‍යතාවයක් ඇතිදැයි දැනගැනීමට පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ii) වෙනත් කරුණු අතර, රජය මගින් ඔහු සඳහා මැනුම් උපකරණ සහ අදාල වෙනත් උපකරණ සකස් කිරීම, නඩත්තුව හා අළුත්වැඩියා කිරීම පිළිබඳව මෙරට හා පිටරට පිළියෙල කරනු ලබන ඕනෑම පුහුණුවීමේ පාඨමාලාවක් විශ්වාසවන්තව හා ලැදියාවෙනුත් පරිශීලනය කොට, සතුටුදායක අන්දමින් හදාරා නිම කිරීමට හා නියම කරන්නේ නම්, පුහුණුවීමේ පාඨමාලාව නිම කළ පසු යාන්ත්‍රික ෆෝර්මන් කෙනෙකු හැටියට (රජය විසින් තීරණය කරනු ඇති) නියමිත අවුරුදු ගණනක කාලසීමාවක් රජයට සේවය කිරීමට බැඳී සිටීමට රජය සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය.

(iii) ඔහු විසින් රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරනු නො ලැබේ නම්, ගිවිසුමේ නියමයන් හා කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වුවහොත්, පුහුණුවීමේ මුළු වියදම් රජයට ආපසු ගෙවීමට එකඟ වෙමින් රු. 35,000 ක් බැගින් වත්කම ඇති අනුමත කළ ඇපකරුවන් දෙදෙනකු සමඟ බැඳුම්කරයකට ඇතුළත් වීය යුතු යි.

වැටුප්, දීමනා, ගමන් ගාස්තු, ඉගැන්වීමේ ගාස්තු හා රජය හා වෙනත් විදේශීය නියෝජිත ආයතනයන් විසින් දරනු ලැබූ වෙනත් වියදම් පුහුණුවීමේ වියදමට ඇතුළත් වේ.

(iv) ඔහු විසින් රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරනු ලැබේ නම්, ගිවිසුමේ නියමයන් හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් පුහුණුවේ ඉහතකී පරිදි මුළු වියදම රජයට ආපසු ගෙවීමට එකඟවීමේ පුද්ගලික බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(v) අයදුම්කරු යාන්ත්‍රික ෆෝර්මන් කෙනෙකු ලෙස පත්කරනු ලැබූ දිනයේ සිට ගිවිසුම හා බැඳුම්කරය ක්‍රියාත්මක වේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය මෙසේ ය : වර්ෂයකට රු. 2,820—120 බැගින් වැඩිවීම් 9 සහ 180 බැගින් වැඩිවීම් 8—රු. 5,340 (රු. 4,080 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) (රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් මු. රෙ. 1120 අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පියවරක ඔහු පිහිටුවනු ලැබේ.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයකුම තමා පහත සඳහන් අවශ්‍යතාවයන්ගෙන් යුක්ත බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය :—

(අ) යහපත් චරිතයකින් හා හොඳ ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුතු බව (2) (ඈ) (1) ඡේදය බලන්න.

(ආ) 1969 සැප්තැම්බර් 5 වැනි දිනට වයස අවුරුදු 20 ට අඩු නො විය යුතු අතර, 30 ට වැඩි නො විය යුතු ය. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නො වේ).

(ඇ) (i) මූලික ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථ හා සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන විෂයයෙන් සාමාර්ථ සහිතව දෙවරකට වැඩි නො වන වාර ගණනකදී විෂයයන් 6 කින් පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථයක්. (තෝරාගත් අපේක්ෂකයා එතර පුහුණුවකට යවන්ට වුවමනා නම්, ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් තිබේ නම්, ඊට විශේෂයෙන් සැලකීමක් දක්වනු ලැබේ) සහ ;

(ii) කටුබැද්දේ ප්‍රායෝගික විද්‍යායතනයෙහි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අවුරුදු 3 ක (අර්ධකාලීන) පාඨමාලාව හෝ, ලංකා කාර්මික විද්‍යාලයේ කර්මාන්ත ශාලා පුහුණුව පිළිබඳ අවුරුදු 2 ක පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බවට සහතිකයක් හෝ ඒවා හා සමාන සුදුසුකමක් සහ ;

(iii) (කෙසේ නමුදු මේ අවස්ථාවේදී පමණක් පිළිගත් කර්මාන්තශාලා හා වැඩපොළවල්හි අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති ඉල්ලුම්කරුවන් ගැන සළකා බලනු ඇත. එසේ තෝරාගනු ලබන අයදුම්කරු පිළිගත් කර්මාන්තශාලාවක හෝ වැඩපොළවල හෝ මෙම දෙපාර්තමේන්තුවේ හෝ නියමිත මුළු අවුරුදු 6 ක පළපුරුද්ද සම්පූර්ණ කරන තුරු, කෙළින්ම බඳවාගනු ලැබුවකු නම් වැටුප් ක්‍රමයේ ආරම්භක වැටුප මතද, රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර තනතුරක් දරන්නකු නම් මු. රෙ. 1120 යටතේ නිශ්චය කරනු ලබන වැටුප් පියවර මතද, තබනු ලැබේ.)

සැ. යු.—අවම අධ්‍යාපනික සුදුසුකම ලෙස කණිෂ්ඨ පාඨශාලා සහතිකය හා පිළිගත් කර්මාන්තශාලා හා වැඩපොළවල අවුරුදු 12 ක පළපුරුද්දක් ඇති, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ උපකරණ අංශයේ ආර්ටිපයිසර් හා ප්‍රධාන ආර්ටිපයිසර්වරුන්ගෙන් අයදුම්පත් පිළිගනු ලැබේ.

පාලන ශ්‍රේණියේ පළපුරුද්දක් වේ නම් ඒ විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

5. ඉල්ලා සිටි විටකදී, පහත සඳහන් ලේඛනවලින් සමහරක් හෝ සියල්ලම අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර හෝ භාරගනු නො ලැබේ).

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ සහතික දෙකක්. (මින් එකක් අයදුම්කරු අවසන් වරට ඉගෙනුම ලැබූ පාසැලේ ප්‍රධානාචාර්යවරයා ගෙන් ලබාගත් එකක් විය යුතුය).

(ඈ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) වෘත්තියේ පළපුරුද්ද පිළිබඳව ලබන ලද සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත්වූ උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) පහත දැක්වෙන ආදර්ශ අයදුම්පතේ සඳහන් ලේඛනවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම් පත සමග එවිය යුතුය.

(ii) ඉල්ලා සිටි විටදී ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සළකා බලනු නො ලැබේ.

(iii) (ඇ) උප ඡේදය යටතේ දක්වා ඇති සහතික, දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් විසින් හෝ 4 වෙනි ඡේදය කෙලවර දැක්වෙන සටහන යටතේ අයදුම්කරු විසින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

6. රාජ්‍ය සේවයේ යෙදී සිටින නිළධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම් පතේ පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ලැබෙන සේ සර්වේ ජනරාල් (ආයතන අංශය) වෙත කෙලින්ම එවිය යුතුය.

7. අයදුම්පත් සර්වේ ජනරාල් වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නමට එවිය යුතු නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත ලැබුණ බව දන්වනු ඇත. 1969 සැප්තැම්බර් 11 වැනි දිනට පෙර අයදුම්පත ලැබුණු බව දන්වා ලිපියක් නොලත් අයදුම් කරුවකු වෙත් නම් වහාම ඒ බව සර්වේ ජනරාල් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මෙම අවශ්‍යතාව ඉටු කිරීමට අසමත් වුවහොත් තම අයදුම් පත සළකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ඊ. ගුණවර්ධන,
වැඩ බලන සර්වේ ජනරාල්.

1969 ජූලි 31 වැනි දින,
තැ. පෙ. 506, කොළඹ,
(ආයතන අංශය),
සර්වේ ජනරාල් කාර්යාලයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(සැ. යු.—සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කිසිම කොටසක් හිස්ව තැබිය යුතු නොවේ. ඉරක් ඇඳ තිබීම පිළිතුරක් ලෙස සළකනු නොලැබේ.)

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව—යාන්ත්‍රික ෆෝර්මන් තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3 පුරවැසි භාවය හා ජාතිය :————.

(පුරවැසි භාවය පෙළපතින් ද ලියාපදිංචි කිරීමෙන් ද යන වග සඳහන් කළ යුතුය. පුරවැසි භාවය ලියාපදිංචි කිරීමෙන් නම්, ලියාපදිංචි කළ සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න.)

4. (අ) 1969.9.5 දිනට නියම වයස :—

අවුරුදු :——, මාස :——, දින :——.

(ආ) උපන් දිනය :—

අවුරුද්ද :——, මාසය :——, දිනය :——.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) ඔහුගේ පියා :————.

(ඇ) ඔහුගේ/පියාගේ පියා :————.

(ඈ) ඔහුගේ පියාගේ පියාගේ පියා :————.

6. විවාහකද? අවිවාහකද? යන වග හා දරුවන් වේ නම් දරුවන් ගණන :————.

7. (i) සමර්ථ වූ විභාග :—

(අ) පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම :————.

(ආ) විභාගයේ නම :————.

(ඇ) වර්ෂය හා මාසය :————.

(ඈ) මධ්‍යස්ථානය හා විභාග අංකය :————.

(ඉ) සමර්ථ වූ විෂයයන් :————.

(සම්මාන සාමාර්ථද සාමාන්‍ය සාමාර්ථද යන වග සඳහන් කරන්න.)

(ඊ) සමර්ථ වූ ඉහළම විභාගය :—

සිංහල :————.

දෙමළ :————.

ඉංග්‍රීසි :————.

(ඔ) පාසැලෙන් අස්වූ දිනය :————.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. (ii) ලබා ඇති කාර්මික වෘත්තීය සුදුසුකම් :—

| විභාගය | ආයතනය | වර්ෂය |
|---|---|---|
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |

(සහතික පිටපත් ඇමිණිය යුතුය)

8. පාසැලෙන් අස්වූ දින සිට, පිළිගත් කර්මාන්ත ශාලා හෝ වැඩ පොළවල යෙදී සිටි රැකියාව හා පළපුරුද්ද පිළිබඳව විස්තර සඳහන් කරන්න :—

(අ) ආයතනයේ නම :————.

(ආ) සේවය ආරම්භයේදී හා අවසානයේදී ලැබූ වැටුප : ————.

(ඇ) වැඩ පිළිබඳ තොරතුරු :————.

(ඈ) සේවා කාලය (වර්ෂය හා මාසය) :————.

(ඉ) සේවයෙන් පහකිරීමට හෝ සේවය නවතා දැමීමට හේතු දක්වන්න. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. සේවය කඩවී ඇතිනම් ඊට හේතු) :————.

9. විශේෂ සුදුසුකම් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.

10. අයදුම්කරු අධිකරණයකදී කිසියම් අපරාධයක් පිළිබඳව චෝදනා ලැබී හෝ වරදකරුවී දඬුවම් විඳ ඇද්ද? එසේ නම් :—

(අ) දිනය :————.

(ආ) නඩු අංකය :————.

(ඇ) උසාවියෙහි නම :————.

(ඈ) චෝදනාවේ සවභාව :————.

(ඉ) වරදකරුවී නම් ලැබූ දඬුවමෙහි සවභාවය සඳහන් කරන්න :————.

11. දැන් කරන රැකියාව පිළිබඳ තොරතුරු :—

(අ) ආයතනයේ හෝ දෙපාර්තමේන්තු නම :————.

(ආ) රැකියාවට පත්කරනු ලැබූ දිනය :————.

(ඇ) ශ්‍රේණිය :————.

(ඈ) වැටුප් පරිමාණය හා දැන් ලබන මූලික වැටුප : ————.

(ඉ) ස්ථිරද තාවකාලිකද යන වග :————.

(මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින්, (ආ) සිට (ඉ) දක්වා තොරතුරු සැපයිය යුතු නොවේ.)

12. මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සැබෑ බවටද නිවැරදි බවටද, සහතික කර සිටිමි. මෙහි දක්වා ඇති විස්තර යම් හෙයකින් අසත්‍ය බව හෝ වැරදි බව හෝ පත්වීමට පෙර දැන ගන්නට ලැබුණොත් තෝරා ගැනීමට සුදුස්සකු නොවන බවද පත්වීමට පසු දැන ගන්නට ලැබුණොත් කිසිම වන්දි මුදලක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට හා ඇතුළත්වනු ලබන ශිවිසුමට හා බැඳුම්කරය යටතේ දඬුවම් ලැබීමට යටත්වනු බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ලිපිනය :————.

දිනය :————.

13. අයම්දුකරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් සම්පූර්ණ කළ යුතුය.

11. වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය නිවැරදි බව හා ඔහුගේ සේවය මුළු කාලය තුළම සතුටුදායක බව මම සහතික කරමි. කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසිය අනුව (ඔහු තෝරා ගනු ලැබුවහොත්) වැඩබලන පදනමක් මත ඔහු මුදා හැරීමට මම එකඟවෙමි/එකඟ නොවෙමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.

දිනය :————.

8-499—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### සහන නිවේදක තනතුර—වෙළඳ සේවය

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අර්ධ කාලීන සහන නිවේදක (හින්දි) තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අනියම් පදනමක් මත සේවයට බඳවා ගනු ලබන අතර, දිනකට රු. 17.50 උපරිම සීමාවට යටත්ව පැයකට රු. 2.50 ගණනේ ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා කිසිත් ගෙවනු නොලැබේ.

අයදුම්කරුවන් කෙටි කාලීන පුහුණුවක් ලැබිය යුතුයි. එම පුහුණු වීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

අර්ධකාලීන සහන නිවේදකයින් වශයෙන් සේවාව සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ ස්ථිර සේවකයන් නොවන අතර, අවශ්‍ය වන විටදී පමණක් ඔවුන් සේවාවට කැඳවනු ලැබේ.

2. වයස අවුරුදු 18 ටත් 40 ටත් අතර විය යුතු අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත් වූ ගුවන් විදුලි ප්‍රචාරය පිළිබඳව පළපුරුදුකම් ඇති අය විය යුතුයි. සිංහල පිළිබඳ තරමක දැනුම අමතර සුදුසුකමක් වේ. ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවය කරන යථෝක්ත සුදුසුකම් ඇති නිලධාරීනටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

3. මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 අගෝස්තු මස 22 දිනට පෙර ලැබෙන සේ කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "සහන නිවේදක (හින්දි)" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි.

4. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

1969 ජූලි මස 31 වැනි දින,
කොළඹ 7,
ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දීය.

එන්. ඩී. ජයවීර,
අධ්‍යක්ෂ ජනරාල්.

## නිදර්ශන ආකෘති පත්‍රය

### සහන නිවේදක තනතුර (හින්දි)

1. සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය සහ ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
4. ජාතිය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
(සහතික පිටපත ඇමිණිය යුතුයි)
6. භාෂා පිළිබඳ ප්‍රවීණතාව :—
(අ) හින්දි :————.
(ආ) සිංහල :————.
(ඇ) වෙනත් භාෂා :————.
7. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා වෙනත් විශේෂ හිමිකම් පිළිබඳ විස්තර :————.
8. සහතික පත් ලබාගත් අයගේ නම් හා ලිපින :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය).
9. දනට යෙදී සිටින හා කලින් යෙදුණ රැකියාවල් පිළිබඳ විස්තර දින සහිතව :————.

————,
අත්සන.

දිනය :————.

8-480—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### අනුරාධපුර කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු—1969/70

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති අනුරාධපුර කණිෂ්ඨ කාර්මික ආයතනයෙහි බාහිර උපදේශක තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර අනුරාධපුර, කණිෂ්ඨ කාර්මික ආයතනයේ ආයතනාධිපති වෙත 1969 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ යැවිය යුතුය. අපේක්ෂකයින් තම තමන්ගේ අධ්‍යාපනික, වෘත්තීය, කාර්මික සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලුම විස්තර ඉල්ලුම්පත්‍රයේ සඳහන් කළ යුතුය. එක් එක් විෂය සඳහා ඉල්ලුම්පත් වෙන වෙනම තිබිය යුතුය.

2. අනුරාධපුර කාර්මික ආයතනයේ ඇති බාහිර උපදේශක ඇබෑර්තු අදාල විෂයයන් මෙහි පහත සඳහන්කර ඇත. පංති පැවැත්වෙන මාධ්‍යය විෂයය ඉදිරියෙන් පෙන්නුම් කෙරෙයි :—

| | |
|---|---|
| (1) සිංහල භාෂාව | |
| (2) ඉංග්‍රීසි භාෂාව | |
| (3) වෑල්ඩින් වැඩ | සිංහල මාධ්‍යය |
| (4) වඩු ඇඳීම | සිංහල මාධ්‍යය |
| (5) ජලනළ සවිකිරීම, න්‍යාය සහ ප්‍රායෝගික | සිංහල මාධ්‍යය |
| (6) විදුලි කම්බි සවිකිරීම, න්‍යාය සහ ප්‍රායෝගික | සිංහල මාධ්‍යය |
| (7) රේඩියෝ අළුත්වැඩියා න්‍යාය සහ ප්‍රායෝගික | සිංහල මාධ්‍යය |
| (8) මූලික විද්‍යාව | සිංහල මාධ්‍යය |
| (9) ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | ඉංග්‍රීසි මාධ්‍යය |
| (10) ගණිතය | ඉංග්‍රීසි මාධ්‍යය |
| (11) තාපය එළිය හා ශබ්දය | ඉංග්‍රීසි මාධ්‍යය |
| (12) චුම්බකත්වය හා විදුලිය | ඉංග්‍රීසි මාධ්‍යය |

3. බාහිර උපදේශකවරුනට ගෙවන ගාස්තු ඔවුන්ගේ සුදුසුකම් පළපුරුද්ද හා උගන්වන පංතිය අනුව පැයකට රුපියල් 5 සිට රුපියල් 15 දක්වා වෙනස් වනවා ඇත.

4. මෙම තනතුර අවුරුද්දේ ඔක්තෝබර් මස පටන්ගෙන ඊළඟ අවුරුද්දේ අගෝස්තු මස අවසන් වේ. අවශ්‍යතාවයේ හැටියට ඊට කලින් වුවද අවසන් කෙරෙනු ඇත.

5. පංති පැවැත්වෙනුයේ උදේ 8.30 සිට සවස 4.30 දක්වා සහ සවස 5 සිට රාත්‍රී 7.15 දක්වාද හෙයින් මේ කාලය ඇතුළත උගන්වීමට හැකි අයගෙන් පමණක් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ. තමන්ට සුදුසු කාලවේලා ඉල්ලුම්පත්‍රයේ නිසියාකාරව සඳහන් කළ යුතුය.

6. බාහිර උපදේශකවරුන් විසින් මධ්‍ය වාර්ෂික පරීක්ෂණයන් හි සහ අභ්‍යන්තර නොවූ පරීක්ෂණයන් නො යොදවන වර්ෂ අවසාන පරීක්ෂණයන් හිදී අමතර ගාස්තුවක් නොමැතිව තමන්ගේ පංතිවල ශිෂ්‍යයන් පරීක්ෂා කළ යුතුය.

7. රාජ්‍ය සේවයෙහි යෙදී සිටින ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තම තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගිනි. එවැනි ඉල්ලුම් පත්‍ර නියම කරන ලද දිනට පෙර ආයතනාධිපති වෙත නොලැබුණහොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරනු නොලබන්නේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා කලට වේලාවට ලැබී, පිළිගත හැකි හේතුවක් නිසා ප්‍රමාද වුවහොත් පමණි.

8. අයදුම් පත්‍රයේ තමා අපේක්ෂා කරන තනතුරට අදාල විෂයය පැහැදිලිව දක්වීම ඉතා අවශ්‍යතාවයක් බව සැළකුව මැනවි.

එල්. බී. ගුණසේකර,
අධ්‍යාපන අධ්‍යක්ෂ, උතුරු මැද ප්‍රදේශය.

1969 ජූලි මස 30 වෙනිදා,
අනුරාධපුර,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

8–531—69.8.8 දින අංක 14,866 දරන ගැසට් අත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ඇබෑසි ෆෝමන් තනතුරු

නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ ඇබෑසි ෆෝමන්වරු වශයෙන් පත් කිරීමට කටුබැද්දේ, ලංකා කාර්මික විද්‍යායතනයේ කාර්මික ශිල්පීන්ගේ සහතිකය හෝ අම්පාරේ තාක්ෂණ කාර්මික ආයතනයේ එම සහතිකය හෝ මෑතදී ලබාගත් අය ගෙන් අයදුම් කැඳවේ.

ඉහත සඳහන් විභාගයන්ගේ අවසාන පරීක්ෂණයන් ට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගේ අයදුම් ද සලකා බලනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 2ක් කාලයක් තුළ පුහුණුවිය යුතු අතර, එකී කාලය තුළදී සියලු දීමනා අඩංගු රු. 300ක මාසික දීමනාවක් ගෙවනු ඇත. සංයුක්ත මණ්ඩලය විසින් නියම කෙරෙන තත්ත්වය ලබන පුහුණුවන්නන් ප්‍රථමයෙන් රු. $\frac{360—450}{6\times15}$ මාසික සියලු දීමනා අඩංගු වැටුප් ක්‍රමය මත II වෙනි ශ්‍රේණියේ ෆෝමන්වරුන්ගේ තනතුරු සඳහා පත් කිරීමට සලකා බලනු ඇත.

තවද, පහත දක්වෙන වැටුප් ක්‍රම මත ඉහළ ශ්‍රේණිවලට උසස් විය හැක—

I වෙනි ශ්‍රේණිය—රු. $\frac{400—600}{8\times25}$ මාසික සියලු දීමනා අඩංගු.

ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය—රු. $\frac{550—750}{8\times25}$ මාසික සියලු දීමනා අඩංගු

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල, අයදුම්කරුගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 1969.8.22 දිනට හෝ ඊට පෙර මෙහි පහත ඇති ලිපිනයට සාමාන්‍යාධිකාරි වෙතට ලැබෙන සේ එවිය යුතුය.

අයදුම් ආකෘති පත් සඳහා තැපෑලෙන් අයදුම් කරන විට තම ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

අයදුම් කළ යුත්තේ ඉහතින් දක්වා ඇති සුදුසුකම් ඇති අය පමණකි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367, 135, යුනියන් පෙදෙස, කොළඹ 2,
1969 ජූලි 24 දින.

8–473—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පශ්චාත් උපාධි පුහුණුව සඳහා අයදුම්පත් කැඳවීම (ආයු. කලාචාර්‍ය) 1969/70 අධ්‍යයන වර්ෂය

1969.7.11 වැනි දින අංක 14,862 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 69.7.3 දින දරණ නිවේදනයට අමතර වශයෙනි.

2. **ඇතුළත් වීමට සුදුසුකම්.**—(මෙය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.) :—

(i) පිළිගත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයක උපාධිධරයෙකු වීම හෝ ඊට සම තත්ත්වයේ උපාධියක් ලැබ සිටීම.

(iii) වෙනුවට පහත සඳහන් සටහන බලපානු ලැබේ.

**සටහන.**—ආයුර්වේද වෛද්‍ය උපාධිය පළමුවැනි හෝ දෙවැනි ශ්‍රේණියෙන් සමත් වූ හෝ 1965 ට පළමු උපාධිය ලැබූ අපේක්ෂකයෙකු නම් ගෞරව හෝ එකවර සියලුම විෂයයන්ගෙන් අවසාන විභාගය සමත් වූ හෝ අපේක්ෂකයන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඇතුළත් වීමේ පරීක්ෂණයට විෂයයන් යටතේ "නිදාන" යන්න "නිදාන හා කාය චිකිත්සා" යනුවෙන් සංශෝධනය විය යුතු අතර, අංක 6—ශරීර විඥාණ—විෂය එකතු වේ.

ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය 1969 අගෝස්තු 19 දින තෙක් දීර්ඝ කරනු ලැබේ.

පණ්ඩිත විලියම් අල්විස්.
විද්‍යාලයාධිපති.

1969.7.26 දින.

8–376—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන් හි මැණික් කැපීම සහ ඔපදැමීම පිළිබඳ උපදේශක තනතුර සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වූ අයදුම් පත් 1969 අගෝස්තු 29 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ "මැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ උපදේශක තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය (දැනට මෙම තනතුර ඇබෑර්තුව ඇත්තේ ගාල්ල කණිෂ්ඨ කාර්මික ආයතන යෙහිය).

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(i) 1969.8:29 වන දිනට වයස අවුරුදු 21 ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි බව, (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදාල නොවේ.)

(ii) විශිෂ්ඨ චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව.

(iii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයෙන් හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය ඇතුළු විෂයයන් 6කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් හෝ,

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටින බව. සහ

(iv) (අ) මහා බ්‍රිතාන්‍යයේ මැණික් විද්‍යා සංගමයේ '' මැණික් විද්‍යාව '' පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ; හෝ

(ආ) සමාන හෝ උසස් සුදුසුකම් ; සහ

(v) පත්කරනු ලබන්නාට සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. නැතහොත් පත්වීම ලැබී අවුරුදු තුනක් ඇතුලත සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගතයුතුය.

4. (i) මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 සහ 180 × 8 5,340 වේ. රු. 4,080 සහ රු. 4,800 ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම්වලින් සමත් විය යුතුය

(ii) පත් කර ගනු ලබන්නා සෑහෙන ප්‍රායෝගික සහ/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර අවුරුදු 5 කට අඩු පලපුරුද්දක් ඇති අයකු තෝරාගනු ලැබුවහොත්, ඔහු විසින් අවශ්‍ය පලපුරුද්ද ලබාගන්නා තෙක් වාර්ෂිකව රු. 3,420 ක නියමිත වැටුපක් සහිත වැඩ බැලීමේ පදනමක් මත පත් කරනු ඇත.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම අයදුම් පත්‍රයේ පිටපතක් කෙලින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලි පිටපත් (මුල් පිටපත් නොවේ). ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය, හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්,

(**සැළකිය යුතුය** :—දැනට රජයේ සේවයේ නියුතු අයදුම් කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදාල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු කොටසේ දෙවන ඡේදයේ ආර්ම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු 1 වැනි දින,
කොළඹ 2 මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ ෆුල්ස්කැප් කඩදාසිවල සකස් කළ යුතුයි)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

## මැණික් කැපීම සහ ඔපදැමීම පිළිබඳ උපදේශක තනතුර සඳහා අයදුම් පත්‍රය

(සැදහුම: සාප 3/230)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න) :———— (මහතා/මහත්මිය/මෙනවිය)

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————, මාස :————, දින :————.
(ආ)' උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය : ————. (උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————:
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද? අවිවාහකද? වැන්දඹුද? :————.
(ආ) විවාහක නම්, (අ) විවාහ වූ දිනය :————.
(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| (1) | | | | | |
| (2) | | | | | |
| (3) | | | | | |
| (4) | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමඟ :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර
(අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද? :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණ ද? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් : (අ) සේනාංකය; (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—
(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—
(i) (අ) තනතුර, ශ්‍රේණිය හා, (ආ) ඊට පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිත ද? තාවකාලික හෝ අනියම් ද? :————.
(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙසින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### භාෂා හා සාමාන්‍ය විෂයයන් පිළිබඳ උපදේශක (ඉංග්‍රීසි) තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයන්හි භාෂා හා සාමාන්‍ය විෂයයන් පිළිබඳ උපදේශක (ඉංග්‍රීසි) තනතුරු සඳහා පහත දක්වා ඇති සුදුසුකම් ඇති ඉල්ලුම් කරුවන්ගෙන්, ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙලවූ අයදුම් පත් 1969 අගෝස්තු 29 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැන, (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ "භාෂා හා සාමාන්‍ය විෂයයන් පිළිබඳ උපදේශක (ඉංග්‍රීසි) තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිරය· විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය. පත්වීම සාමාන්‍ය වශයෙන් තුන් අවුරුදු ආධුනික කාල සීමාවකට යටත් වේ. දනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.

3. මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම් කරුවෙක්ම පහත දක්වෙන සුදුසුකම් ඇති බවට පිලිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.—

(i) 1969.8.29 වන දිනට වයස අවුරුදු 21 ට නො අඩු අවුරුදු 40 ට නො වැඩි බව, (දනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහල වයස් සීමාව අදල නොවේ.)

(ii) විශිෂ්ය චරිතයෙන් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත බව,

(iii) (අ) "ඉංග්‍රීසි" විෂයය සහිතව පහත සඳහන් විෂයයන්ගෙන් යටත්පිරිසෙයින් විෂයයන් දෙකක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාතිබීම. සිංහල/දෙමළ, භූගෝලය, අර්ථ ශාස්ත්‍රය, ගණිතය ; හෝ

(ආ) පහත සඳහන් විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් විෂයයන් තුනක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරන ලද පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබාතිබීම. භූගෝලය, අර්ථ ශාස්ත්‍රය, ගණිතය, සිංහල/දෙමළ ; සහ

ජ්‍යෙෂ්ය පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී, ඉංග්‍රීසි විෂයය සඳහා හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ "අ" නිර්දේශය ඉංග්‍රීසි විෂයය සඳහා හෝ සම්මාන සාමාර්ථ. යක් ලබා තිබීම. නැතහොත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී හෝ උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඉංග්‍රීසි විෂයය සඳහා සාමාර්ථයක් ලබාතිබීම; සහ

(iv) සිංහලෙන්/දෙමළෙන් ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුය. එසේ නැත්නම් පත්වීමේ දින සිට අවුරුදු තුනක් ඇතුළත සිංහලෙන්/දෙමළෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගත යුතුය.

**සටහන :**—ඉගැන්වීමේ පලපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

4. (i) මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4 සහ 180 × 8—5,340 වේ. රු. 4,080 සහ රු. 4,800 ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉම්වලින් සමත් විය යුතුය.

5. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේ දී ලැබී, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ. තවද සෑම අයදුම්කරුවකුම තම අයදුම් පත්‍රයේ පිටපතක් කෙලින්ම මෙම අමාත්‍යාංශය වෙත එවිය යුතුයි.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වෙන ලියවිලි වල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය භාරගත නොහැක.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ සුදුසුකම්, චරිතය, හා තනතුරට ඇති සුදුසුකම් පිළිබඳ සහතික 3 ක්,

(**සැළකිය යුතුය.** : දනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් ඉහත (ඇ) අනුඡේදය අනුව සහතික ඉදිරිපත් කිරීම නුවුවමනාය.)

7. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් අදල ලියකියවිලි, මෙම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනට හැර වෙනත් කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ පළමු වැනි කොටසේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14 ක් ගෙවුනු කළ පිළිතුරක් නො ලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 1 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ පුල්ස්කැප් කඩදසියේ සකස් කළ යුතුයි)

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

### භාෂා හා සාමාන්‍ය විෂයයන් පිළිබඳ උපදේශක (ඉංග්‍රීසි) තනතුරු සඳහා අයදුම් පත්‍රය

සැදහුම : සාප 3/ප1/නා/ප–104/1)

1. සම්පූර්ණ නම (පැහැදිලි ලෙස ලියන්න :———— (මහතා/මහත්මිය/මෙනවිය)

2. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි)

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන්ද, (ආ) ලියාපදිංචි වීමෙන්ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ, ලියාපදිංචි කිරීමෙන් නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————, මාස :————, දින :————.
(ආ) උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය ————. (උප්පැන්න සහතිකයේ පිටපත් අමුණන්න.)

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. (අ) විවාහකද? අවිවාහකද? වැන්දඹුද? :————.
(ආ) විවාහක නම්, (අ) විවාහ වූ දිනය :————.
(ii) ළමයි ගණන :————.

7. (අ) වයස අවුරුදු 15 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය (ලබා ඇත්නම්) | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| (1) | | | | | |
| (2) | | | | | |
| (3) | | | | | |
| (4) | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස්වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය, දිනයන් සමඟ :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර, (අ) ලැබූ දින හා (ආ) ආයතනවල නම් ද සඳහන් කරන්න :————.

10. කියවීම, ලිවීම, කථා කිරීම හා භාෂා පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් තිබේ ද? :—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් :————.

(නිවේදනයෙහි සඳහන් කොට ඇති, විශේෂ සුදුසුකම් හා/හෝ පළ පුරුද්ද ඔබට තිබේද? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින, වකවානු සහිතව සඳහන් කරන්න.)

12. කිසියම් අපරාධ වරදක් නිසා, අධිකරණය මගින් වරදකරු කරනු ලැබේ ද? එසේ නම් (අ) දිනය (ආ) නඩු නොම්මරය හා (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

13. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නොවේ නම්, ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණ ද? :————.

14. වෙනත් විස්තර (වෙනත් විශේෂ හිමිකම් ආදිය) :————.

15. චරිත සහතික ලබාගත් අයගේ නම් හා පදවි නාම (මේ සහතිකවල පිටපත් මිස, මුල් ලිපි ඉදිරිපත් නො කළ යුතුයි. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම්, මේ අවශ්‍ය නැත.) :————.

16. සේවා මුක්ත භටයෙක් නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේවයට බැඳුන හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————

17. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :————.
(i) දරන ලද තනතුර :————.
(ii) නියුක්තව සිටි දින වකවානුව :————.
(iii) අස්වීමට හේතුව :————.

(ආ) ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයක් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්, (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර, (ආ) සේවයේ යෙදී සිටි දින, (ඇ) සේවය නතර කිරීමට හේතුව සඳහන් කරන්න :————.

18. දැනට යෙදී සිටින රක්ෂාව :—
(i) (අ) තනතුර, ශ්‍රේණිය හා (ආ) ඊට පත්වූ දිනය :————.
(ii) විශ්‍රාම වැටුප් සහිත ද? තාවකාලික හෝ අනියම් ද? :————.
(iii) (දීමනා රහිතව) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.
(iv) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර, සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

දිනය :————.

————
අයදුම්කරුගේ අත්සන.

8–548/2—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාලයීය ප්‍රවේශ පරීක්ෂණය (විශේෂ පන්ති) 1969

1969.8.13 දින සිට පැවැත්වීමට නියමිතව තිබූ පූර්වෝක්ත විභාගය 1969.8.22 දින දක්වා කල් දමා ඇත.

කේ. ඊ. ඩබ්ලිව්. ප්‍රමතුංගුරිය.
වැඩ බලන විභාග කොමසාරිස්.

1969 ජූලි මස 30 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

8–377—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සහ රජයේ අනිකුත් නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1969 ඔක්තෝබර් මස

1963.4.27 වැනි දින දරණ ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා 1963 ජූලි මස 12 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලංකා පරිපාලන සෙවයේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පරීක්ෂණය පහත සඳහන් දිනයන්හිදී පැවැත්වෙන බැව් මෙයින් නිවේදනය කෙරේ :—

1969 ඔක්තෝබර් 26 නීතිය
1969 ඔක්තෝබර් 27 නීතිය
1969 ඔක්තෝබර් 28 සිංහල ලිඛිත *
1969 ඔක්තෝබර් 29 දෙමළ ලිඛිත
} ලංකා පරිපාලන සහ විදේශ සේවයෙහි යෙදී සිටින්නන් විසින් මේ දිනවල මෙම විෂයයන් ගත් නවා ඇත.

1969 ඔක්තෝබර් 30 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නීති, පාලන රෙගුලාසි සහ ගිණුම්

1969 ඔක්තෝබර් 31 නීතිය (අනෙක් නිලධාරීන් සඳහා)

1969 නොවැම්බර් 2 සිංහල/දෙමළ (වාචික)

1969 නොවැම්බර් 3 සිංහල/දෙමළ (වාචික)

(මේ කාල සටහන වෙනස් කිරීමට ඉඩ තේබ්)

සටහන :

අපේක්ෂකයින්ට :—

(1) රාජ්‍ය සේවා කොමිෂන් සභා නීති සහ පාලන රෙගුලාසි;

(2) ගිණුම් ; සහ

(3) නීතිය

පත්‍රවලට රාජ්‍ය භාෂාවෙන්ද ඉදිරිපත් වීමට, විභාග කොමසාරිස් විසින් කටයුතු සලස්වා ඇත.

* 1956 සැප්තැම්බර් මාසයේ 24 වැනි දිනට පසු සිවිල් සේවයට හා ලංකා පරිපාලන සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා සිංහල පරීක්ෂණයද ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 27 වැනි වගන්තිය යටතේ දක්වා ඇති සිංහල පරීක්ෂණයද පහත දැක්වෙන කොටස් දෙකෙන් සමන්විත වේ :—

(1) භාෂාව හා රචනය ... ... පැය 3 යි

(2) පරිවර්තනය ... ... පැය 3 යි

2. විදේශ සේවයේ ආධුනිකයන්, පොලිස් හමුදාවේ නිලධාරීන්, සුරාබදු දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, රබර් කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව, ගුවන් සේවා දෙපාර්තමේන්තුව හා තක්සේරු දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා පැවැත්වෙන පරීක්ෂණයත් රජයේ වැඩ දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තැපැල් සහ විදුලි පණිවුඩ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරි මාර්ග දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව, වරාය ඉංජිනේරු තැනගේ දෙපාර්තමේන්තුව, කොළඹ වරාය කොමිසම, විදුලි කටයුතු දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, වෙළඳ දෙපාර්තමේන්තුව, කර්මාන්ත දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සහ පුරාණ ද්‍රව්‍ය පරීක්ෂකවරුන් සඳහා පැවැත් වෙන වාචික පරීක්ෂණයත් ඉහත කී දිනයන්හි දී ඒ ස්ථානයේ දීම පැවැත්වේ.

3. පහතින් දැක්වෙන අන්දමට පුල්ස්කැප් පිටු බාගයක පිළියෙල කරගත් අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් එවිය යුතුය.

4. විභාගය පැවැත්වෙන්නේ විභාග කොමසාරිස්තුමන් යටතේ ය. එබැවින් විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති සහ රෙගුලසිවලට අයදුම්කරුවන් යටත් වෙනවා ඇත.

5. ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියන්ගේ මාර්ගයෙන් කොළඹ 2, මැලේ වීදිය, විභාග කොමසාරිස්තුමන් වෙත 1969 සැප්තැම්බර් මස 11 වැනි දින හෝ ඊට පෙර රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන කවර ඉල්ලුම්පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. කිසිම අපේක්ෂකයකුට යටත් පිරිසෙයින් විභාගය පවත්වන දිනට දවසකට කලින්වත් තම ප්‍රවේශපත්‍රය නොලැබුන හොත්, ඔහු පහත දැක්වෙන විස්තරත් සමග " විභාග කොමසාරිස්, මැලේ

වීදිය, කොම්පඤ්ඤ වීදිය, තැ. පෙ. 1503, කොළඹ 2" යන ලිපින යට (විදුලි පණිවුඩ ලිපිනය : "විභාග" කොළඹ) ඒ බව දන්වා එවිය යුතුය :—

1. විභාගයේ නම :————.
2. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
3. සම්පූර්ණ ලිපිනය :————.
4. ඉල්ලුම්පත්‍රය රෙජිස්ටර් කළ තැපැල් කාර්යාලය, රෙජිස්ටර් අංකය හා අයදුම්පත තැපැල් කළ දිනය :————.

(නුදුරුව සිටින අපේක්ෂකයින් පණිවුඩකරුවකු මඟින් විභාග කොමසාරිස් (ඊ. ශාඛාව) වෙත දන්වා එවන්නේ නම් මැනවි).

7. ඉහත සඳහන් 6 වන ඡේදයට අනුකූලව ක්‍රියා නොකරන අපේක්ෂකයින් පසුව එවනු ලබන ලිපි සලකා බලනු නොලැබේ.

එම්. රාජේන්ද්‍ර,
භාණ්ඩාගාරයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය, කොළඹ,
1969 ජූලි මස 30 වැනි දින.

## අයදුම් පත්‍රය

### ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

ලංකා පරිපාලන සේවය, විදේශ සේවය සහ රජයේ අනෙක් සේවයන්හි යෙදී සිටින (වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන් හැර) නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය —අප්‍රේල්/ඔක්තෝබර්* 19 ..................

*(නොයෙදෙන වචන කපන්න)

කොළඹ 2, මැලේ වීදිය, විභාග කොමසාරිස්තුමන් වෙත තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් රෙජිස්ටර් තැපෑලෙන් යවනු සඳහාය. ඉල්ලුම් පත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ විභාගයේ නම සඳහන් කරන්න.

1. පෙළපත් නම :————.
   අනෙක් නම් :————.
2. උපන් දිනය :————.
3. තනතුර :————.
   දෙපාර්තමේන්තුව :————.
4. ලිපිනය (ප්‍රවේශ පත්‍රය එවනු සඳහාය) :————.
5. ඔබ අයත්වන සේවය (නොයෙදෙන දෑ කපා හරින්න)—පරිපාලන විදේශ/දෙපාර්තමේන්තුව
6. දැන් ගන්නා විභාගය (නොයෙදෙන දෑ කපා හරින්න)—පරිපාලන සේවය.
   (අ) V වැනි පංතියට බඳවා ගත් නිලධාරීන් පිණිස 1 වැනි කා. ක.
   (ආ) V වැනි පංතියේ හා IV වැනි පංතියේ නිලධාරීන්ට 2 වැනි කා. ක.

විදේශ සේවය (අ) 1 වැනි විභාගය
(ආ) 2 වැනි විභාගය

දෙපාර්තමේන්තුවක නම් දෙපාර්තමේන්තුව :————.

7. ඔබ ගන්නා විෂයයන් පැහැදිලි ලෙස සටහන් කරන්න :—
   (i) :————.
   (ii) :————.
   (iii) :————.
   (iv) :————.
   (v) :————.
   (vi) :————.
8. ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :————.
9. අයදුම්කරුගේ අත්සන සහ දිනය :————.

විභාග කොමසාරිස්තුමන් වෙතය. ඉහතින් දක්වෙන අයදුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඉහත සඳහන් කරන ලද තොරතුරු ඇතුළත් අපේක්ෂකයා විභාගය සඳහා සුදුස්සකු බව මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ තනතුර.

දිනය :————.

8–426—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කෘෂිකර්ම ගුරුවරුන් පිළිබඳ අභ්‍යාස පාඨමාලාව

කෘෂිකර්ම ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අභ්‍යාස පාඨමාලාවක් 1970 ජනවාරි මස අම්පාරේ හාඩි කාර්මික අභ්‍යාස ආයතනයේ දී ආරම්භ වේ. අභ්‍යාස පාඨමාලාවේ කාල පරිච්ඡේදය එක් අවුරුද්දකි. මෙම පාඨමාලාව සාර්ථක ලෙස හදාරා නිමවන අයට විශේෂ පුහුණු ගුරු සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ. අවුරුදු 3 ක සතුටුදායක සේවයෙන් පසු මෙම දෙවැනි පෙළ පුහුණු සහතික පත්‍රය පළමුවැනි පෙළට උසස් කරනු ලැබේ.

2. මෙම අභ්‍යාස පාඨමාලාව සාර්ථක ලෙස හදාරා විශේෂ පුහුණු ගුරුවරුන් වශයෙන් පත්වීම් ලබන පුහුණුව ලබන්නන් රු. 1,860—120—2,100 වැටුප් ක්‍රමය මත පිහිටුවනු ලැබේ. සහතික පත්‍ර පළමු වැනි පෙළට උසස් කළ විට වැටුප් ක්‍රමය රු. 2,220—120, 180—රු. 4,620 වේ. මෙම වැටුප් ක්‍රමය ලැබීම සඳහා මේ ගුරුවරුන් යටත් පිරිසෙයින් සතියකට පැය දහයක් කෘෂිකර්මය ඉගැන්වීම අවශ්‍ය වේ.

3. අපේක්ෂකයින් .—

(අ) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(ආ) ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ඉ) 70.1.1 වැනි දිනට වයස අවුරුදු 18 ට වැඩි වියයුතු අතර 45 ට අඩුවිය යුතුය.

(ඊ) අපේක්ෂකයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී ලංකා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වී තිබිය යුතුය. ඔවුන් පේරාදෙනියේ හෝ කුන්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි කාර්මික අභ්‍යාස ආයතනයේ හෝ දෑවුරුදු අභ්‍යාස පාඨමාලාවකින් පසු ලබාගත් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ද ලබා තිබිය යුතුය.

සංලක්ෂ්‍යය :

මෙම පුහුණුව පිරිමින්ට පමණක් සීමා වේ. 3 (ඊ) ඡේදයේ දක්වෙන සුදුසුකම් තිබෙන ගුරුවරුන්ට හා ශිෂ්‍ය ගුරුවරුන්ට ද ගුරුවරුන් නොවන අයට ද මෙම පුහුණුව සඳහා ඉල්ලුම් කළ හැකිය. පුහුණුව සඳහා තෝරාගනු ලබන ගුරුවරුන් නොවන අයට 1969.10.1 වැනි දින සිට ජේ.පා.ස. පත්‍රයට නියමිත වැටුප් ක්‍රමය මෙම උප ගුරුවරුන් වශයෙන් පත්වීම් දී 1970.1.1 වැනි දින සිට අභ්‍යාස පාඨමාලාවට ඇතුළත් කරනු ලැබේ.

4. සුදුසුකම් ඇති සියලුම ඉල්ලුම්කරුවන් පෙරවරු කාලයේ පැය එක හමාරක කාල සීමාවක් තුළ පවත්වනු ලබන සාමාන්‍ය ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටීම අවශ්‍යවන අතර, පස්වරු කාලයේ වාචික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. විභාගය පවත්වනු ලබන දිනය හා ස්ථානය අයදුම්කරුවන් වෙත යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

5. මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීමට කැමති අයගෙන් ඉල්ලුම් පත් ගුරු අධ්‍යාපනය භාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1969 අගෝස්තු මස 25 වැනි දින හෝ ඊට පෙර භාරගනු ලැබේ. ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුත්තේ මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘතිය අනුව නියමිත ආකෘති පත්‍රයෙහිය. මුද්‍රිත ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

ඊ. ඇල්. විජේමාන්න,
අධ්‍යාපන අධ්‍යක්ෂ/ගුරු අධ්‍යාපනය,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1969 ජූලි මස 30 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේදීය.

ආදර්ශ ආකෘති පත්‍රය

1. (අ) නම, මුලකුරු සමග :————.
 (ආ) උපන් දිනය :————.

2. (අ) සම්පූර්ණ නම :————.
 (ආ) ජාතිය :————.

3. ලිපිනය :
 පුද්ගලික :————.
 රාජකාරි :————.

4. අධ්‍යාපන සුදුසුකම් :
 (අ) ශාස්ත්‍රීය සුදුසුකම් :————.
 (ආ) වෘත්තීය සුදුසුකම් :————.

5. ගුරුවරයෙකු වශයෙන් පත්වූ දිනය :————.

6. ශිෂ්‍ය ගුරුවරයෙකු වශයෙන් පත්වූ දිනය :————.

7. දැනට සේවය කරන පාසැලේ නම :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉදිරිපත් කරන ලදී.

————,
අත්සන—විදුහල්පති/මුල්ගුරු.

දිනය :————.

8–437—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**රත්මලානේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි වීආර්—180 විකර්ස් ට්‍රැක්ටර් යන්ත්‍ර 9ක් හා එම ට්‍රැක්ටර් සඳහා ඇති කල් පැනපු අමතර කොටස් මිලදී ගැනීම හා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර්**

කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු 30 දින පෙ. ව. 11.00 දක්වා රත්මලානේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ඇති පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි වීආර්–180 විකර්ස් ට්‍රැක්ටර් 9 හා එක් එක් ට්‍රැක්ටර් යන්ත්‍රයට කෙලින් හා මෙහි 4 වෙනි ඡේදයේ සඳහන් ටෙන්ඩර් කොන්දේසිවලට යාකර ඇති ලැයිස්තුවේ සඳහන් කර ඇති අමතර කොටස් ප්‍රමාණයන්ද මිලදී ගැනීම හා ඉවත් කර ගැනීම සඳහා රත්මලානේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් 1969 අගෝස්තු 28 වෙනි දින ප.ව. 3.00 දක්වා ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | විෂය අංකය | | දෙපාර්තමේන්තු අංකය | | අමතර කොටස් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1. | විකර්ස් වීආර්—180 ට්‍රැක්ටරය | ... | අයිඩීටී—234 | ... | 95 |
| 2. | එම | ... | ,, —235 | ... | 51 |
| 3. | එම | ... | ,, —236 | ... | 22 |
| 4. | එම | ... | ,, —237 | ... | 23 |
| 5. | එම | ... | ,, —238 | ... | 24 |
| 6. | එම | ... | ,, —239 | ... | 24 |
| 7. | එම | ... | ,, —240 | ... | 19 |
| 8. | එම | ... | ,, —241 | ... | 20 |
| 9. | එම | ... | ,, —242 | ... | 19 |

2. ඉහත සඳහන් ට්‍රැක්ටර් යන්ත්‍ර හා අමතර කොටස් පෙර පෝය දිනයන්හිදී හැර අනිකුත් රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේදී පරීක්ෂාකර බැලිය හැක. ප්‍රදානයන් කරනු ලබන්නේ එක් එක් විෂය බැගිනි.

3. ටෙන්ඩර්කරු විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමට අදහස් කරන එක් එක් විෂය සඳහා රු. 100 බැගින් වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් රත්මලානේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයේද, කොළඹින් පිට නම් කච්චේරියකද තැන්පත් කළ යුතු අතර ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ඒ සඳහා ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ රත්මලානේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් පමණි.

4. ට්‍රැක්ටර් හා අමතර කොටස් ලැයිස්තු හා ටෙන්ඩර් කොන්දේසි ඉහත ඡේදයේ සඳහන් කාර්යාල දෙකින් එකකදී බලාගත හැකි අතර අවශ්‍ය නම් එම කාර්යාලයකදී රු. 1ක මුදලක් ගෙවා හෝ වාරිමාර්ග අධ්‍යක්ෂකගේ නමට රු. 1ක මුදලක් එවා තැපැලෙන් හෝ ලබාගත හැකිය.

ඇල්. ඕ. ද එස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජූලි මස 23 දින,
කොළඹ 7.

8–343—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පොළොන්නරුව උප කොට්ඨාශය

උතුරු මැද පළාතේ පොළොන්නරුව උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා පොළොන්නරුව ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 සැප්තැම්බර් මස 5 වෙනි දින පෙරවරු 10.0 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදුකෙරේ.

| | වැඩ විස්තරය | | | ලියාපදිංචි මුදල රු. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 1. | කණිෂ්ඨ නිලධාරීන්ගේ අංක 1 දරණ නිවාසය ඉදිකිරීම ... | ... ... | ... | 30,000 | ... | 50 |
| 2. | කණිෂ්ඨ නිලධාරීන්ගේ අංක 2 දරණ නිවාසය ඉදිකිරීම ... | ... ... | ... | 30,000 | ... | 50 |
| 3. | මනම්පිටිය—අරලගංවිල පාර වැඩිදියුණු කිරීම හා කැටගල් දමා තාර දැමීම. | 1 වෙනි සැතැප්ම | ... | 60,000 | ... | 100 |
| 4. | එම | 2 වෙනි සැතැප්ම | ... | 65,000 | ... | 100 |
| 5. | එම | 3 වෙනි සැතැප්ම | ... | 65,000 | ... | 100 |
| 6. | එම | 4 වෙනි සැතැප්ම | ... | 60,000 | ... | 100 |
| 7. | එම | 5 වෙනි සැතැප්ම | ... | 65,000 | ... | 100 |
| 8. | එම | 6 වෙනි සැතැප්ම | ... | 68,000 | ... | 100 |
| 9. | එම | 7 වෙනි සැතැප්ම | ... | 75,000 | ... | 100 |
| 10. | එම | 8 වෙනි සැතැප්ම | ... | 70,000 | ... | 100 |
| 11. | එම | 9 වෙනි සැතැප්ම | ... | 70,000 | ... | 100 |
| 12. | එම | 10 වෙනි සැතැප්ම | ... | 71,000 | ... | 100 |
| 13. | එම | 11 වෙනි සැතැප්ම | ... | 75,000 | ... | 100 |
| 14. | එම | 12 වෙනි සැතැප්ම | ... | 80,000 | ... | 100 |
| 15. | එම | 13 වෙනි සැතැප්ම | ... | 70,000 | ... | 100 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණන් වලට හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට සමූපකාර සමිති වලට ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1969 අගෝස්තු මස 30 වෙනි දින පස්වරු 4.30 දක්වා කාර්යාලීය වේලාවන් තුළදී කවුඩුල්ල/මින්නේරිය/පොළොන්නරුව යන වාරිමාර්ග කාර්යාල වලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පමණක් ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වෙන ප්‍රකාශනයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර මෙම වැඩ සඳහා ඉහත සඳහන් ටෙන්ඩර් ඇප මුදල් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මෙම වැඩ සඳහා සියළුම විස්තර සැලැස්ම ආදිය කාර්යාල වේලාවන් තුළදී පොළොන්නරුව වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

ආර්. තුරෙයිරාසා,
වාරිමාර්ග ඉංජිනේරු, පොළොන්නරුව උප කො.

වාරිමාර්ග කාර්යාලය,
පොළොන්නරුව,
1969.7.25.

8–438—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ ජලනල යෝජනා ක්‍රමය

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගත්තොරුව ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීමට හා කුණ්ඩසාලේ ජලනල යෝජනා ක්‍රමයේ වැඩපලට ගෙනවිත් භාර දීම සඳහා වූ මිල ගණන් 1969.8.22 වැනි දින ප. ව. 2.30 දක්වා භාර ගනු ලැබේ.

12″ × 1½″ ඝනකම ඇති අඩි 8 කට නොඅඩු දිගින් යුත් හොර ලෑලි හතරැස් අඩි 1,000 යි.

12″ × 1½″ ඝනකම ඇති අඩි 8 කට නොඅඩු දිගින් යුත් ගිනිසපු ලෑලි හතරැස් අඩි 1,000 යි.

2. අනු පිටපතක් සහිත මිල ගණන් පත්‍ර මුද්‍රා තබන ලද කවරවල බහා, කවරයේ ඉහළ වම් කෙලවරේ " කුණ්ඩසාලේ ජලනල යෝජනා ක්‍රමයට ලෑලි සැපයීම සඳහා මිල ගණන් " යනුවෙන් සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගත්තොරුව ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත නියමිත වේලාවට හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

3. සියළුම මිල ගණන්, මිල ගණන් භාර ගැනීම අවසන් කරන ලද දිනයේ සිට සති තුනක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

4. කිසියම් මිල ගණනක් හෝ සියළුම මිල ගණන් හෝ ප්‍රතික්ෂෙප කිරීමේ අයිතියත්, කිසියම් මිල ගණනක් හෝ කොටසක් පමණක් හෝ පිළිගැනීමේ අයිතියත් රජය සතුවේ.

5. මිල ගණන් පිළිගත් බවට දැනුම් දුන් දින සිට සති 2 ක් ඇතුළතදී මෙම ද්‍රව්‍යයන් සැපයීමට එකඟ විය යුතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969 ජුලි මස 29 වැනි දින,
පේරාදෙනිය.

8–423—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ආයුධ හා උපකරණ සැපයීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයේ, ප්‍රාදේශීය ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් දනට ඇති කොග වලින් පහත සඳහන් ආයුධ හා උපකරණ සැපයීම සඳහා මිළ ගණන් පත්‍ර 1969 අගෝස්තු 24 වැනි දින ප.ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

| මිළ ගණන් | | | සේවාව |
|---|---|---|---|
| ඇල්.කෘු. 686934 | (6) හයයි | ... | හැවි ඩිස්චාර්ජ් බැටරි පරීක්ෂා කිරීමේ උපකරණ |
| ඇල්.කෘු. 686935 | (6) හයයි | ... | බහු කාර්ය මීටර |
| ඇල්.කෘු. 686936 | (12) දෙලහයි | ... | විදුලි බලයෙන් ක්‍රියා කරන බැටරි ආරෝපනය කරන උපකරණ |
| ඇල්.කෘු. 686937 | (12) දෙලහයි | ... | ද්‍රාවමාන |
| ඇල්.කෘු. 686938 | (6) හයයි | ... | වෝල්ට මීටර් |
| ඇල්.කෘු. 686939 | (6) හයයි | ... | ජ්වලනය පරීක්ෂා කිරීමේ උප-කරණ |
| ඇල්.කෘු. 686940 | (6) හයයි | ... | සම්පීඩන පරීක්ෂා කිරීමේ උප-කරණ |
| ඇල්.කෘු. 686941 | (6) හයයි | ... | පෛරෝ මීටර් |
| ඇල්.කෘු. 686942 | (3) තුනයි | ... | භ්‍රම වේගමානය |
| ඇල්.කෘු. 686943 | (6) හයයි | ... | ඇඹරුම් ට්‍රෙරෙන්චස් |
| ඇල්.කෘු. 686944 | (6) හයයි | ... | ක්ෂුද්‍ර මීටර් |
| ඇල්.කෘු. 686945 | (12) දෙලහයි | ... | වර්නියර් කැලිපරය |
| ඇල්.කෘු. 686946 | (6) හයයි | ... | අකුරු ගසන පොන්ච් කට්ටල හා ඉලක්කම් ගසන පොන්ච් කට්ටල |
| ඇල්.කෘු. 686947 | (1) එකයි | ... | වුල්ප් කබ්මාස්ටර් විදිනයට කියත් යාකරන |
| ඇල්.කෘු. 686948 | (1) එකයි | ... | වුලිප් කබ්මාස්ටර් විදිනයට පීඩන කියත් යාකරන |
| ඇල්.කෘු. 686949 | (දුසිම් හයක්) | ... | වැලි තැටි |
| ඇල්.කෘු. 686950 | (12) දෙලහයි | ... | ටයර් පීඩන ආමානයන් |

2. අනුපිටපත් සහිත මිළ ගණන් පත්‍ර එක් එක් උපකරණය සම්බන්ධයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය. මිළ ගණන් මුද්‍රා තබන ලද කවර වල බහා, කවරයේ ඉහළ වම් කෙළවරේ "..............සැපයීම සඳහා මිළ ගණන් ටැන්ඩර අංකය.............." යනුවෙන් සඳහන් කොට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයේ, ප්‍රාදේශීය ටැන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත, මිළ ගණන් නිම කිරීමට නියමිත වේලාවට හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

3. දන්වනු ලබන මිළ ප්‍රමාණයන් ගබඩාවෙන් හෝ දනට නියෝග කර ඇති නැවෙන් ලැබෙන බඩු වලින් එම බඩු 1969.9.20 දිනට පෙර සැපයිය යුතුය.

4. සියලුම ටෙන්ඩර්, ටෙන්ඩර අවසන් කරන ලද දිනයේ සිට සති තුනක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

5. ජයග්‍රාහි ටැන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව භාර දෙනු ලැබූ දිනයේ සිට දින 10 ක් ඇතුළත ටැන්ඩර කරන ලද උපකරණයේ වටිනාකමෙන් 5% කට නොඅඩු ඇප තැන්පත් මුදලක් බැඳීමට සිදුවනු ඇත.

6. ඇප තැන්පත් මුදල ආපසු දෙනු ලබනුයේ කොන්ත්‍රාත්තුව සාර්ථක අයුරින් නිම කිරීමෙන් පසු පමණි.

7. ජයග්‍රාහී ටැන්ඩර් කරුට ඔහුගේ මිළ ගණන් පිළිගත් බැව් දන්වමින් කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහුගේ බලයලත් නිලධාරියා හෝ විසින් ලිඛිත දන්වීමක් එවනු ලබන අතර ජයග්‍රාහි ටැන්ඩර් කරු කෘෂිකර්ම අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතුය.

8. මුද්දර ගාස්තු ගෙවීම සඳහා කොන්ත්‍රාත්තුවට ඇළවීමට අවශ්‍ය මුද්දර ජයග්‍රාහි ටැන්ඩර් කරු විසින් ඔහුගේ වියදමින් ඉදිරිපත් කළ යුතුය.

9. කිසියම් ටැන්ඩර පත්‍රයක් හෝ සියලුම ටැන්ඩර පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතියත් කිසියම් ටැන්ඩරයක් හෝ ටැන්ඩරයක කොටසක් පමණක් හෝ පිළිගැනීමේ අයිතියත් රජය සතුවේ.

10. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ඇති ඉංග්‍රීසි නිවේදනය බලනු මැනවි.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

69.7.29 වෙනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

8–509—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1969-70 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය සඳහා අනුරාධපුර ව්‍යාපාරයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම

අනුරාධපුර ව්‍යාපාරයේ අනුරාධපුර, කුරුණෑගල, පදවිය සහ පුත්තලම යන දිස්ත්‍රික්කවලට අයත් පහත සඳහන් කාර්යාංශ සඳහා ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීමට ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969 අගෝස්තු මස 31 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් කාර්යාංශ**

අනුරාධපුර නවනගර අංශය, මහකනදරාව සහ රාජාංගන දකුණු ඉවුර ගොඩනැගිලි අංශ.

**කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් කාර්යාංශ**

රාජාංගන වම් ඉවුරට අයත් ගොඩනැගිලි අංශ.

**පදවිය දිස්ත්‍රික්කයට අයත් කාර්යාංශ**

පදවිය නවනගරයට අයත් ගොඩනැගිලි අංශ.

**පුත්තලම දිස්ත්‍රික්කයට අයත් කාර්යාංශ**

තබ්බෝව සහ වනාතවිල්ලුව ගොඩනැගිලි අංශ.

**ප්‍රාදේශීය ද්‍රව්‍ය**

1. ඉරු දෙකේ පොල් අතු (දිග අඩි 7ක් සහ පළල අඟල් 18කට නොඅඩු 1,000 බැගින්)
2. දිය ගසන ලද හුණු බුසලක් සඳහා (රාත්තල් 44කට නොඅඩු බරක් ඇති)
3. තම්බාපු හුණු බුසල් වලින්
4. කළුගල් 6×9 කියුබ් වලින්
5. කැටගල් කියුබ් වලින් (2"×1½", 1", ¾" සහ ½")
6. පිලිස්සූ ගඩොල් (8¾" × 4½" × 2¾" යන ප්‍රමාණයේ 1,000 බැගින්)
7. ගංගා වැලි කියුබ් වලින්

සැපයීම සඳහා මිල ගණන් වෙන් වෙන්ව දැක්විය යුතුයි.

(අ) වත්තෙන්/පෝරනුවෙන්/ගල්වලෙන් (සැතපුම් 5ක් ඇතුළත ලොරි යා හැකි ස්ථානයක් විය යුතුයි.) හුණුවලට සහ පොල් අතුවලට සැතපුම් 5 දුර බල නොපානු ඇත.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමට ගෙනවුත් භාර දීමට ඔහුගේ වාහන වලින් (පැටවීම බෑම සහ නියමිත අයුරු ඇසිරීම ඇතුළත්ව)

එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් මුදලින් රු. 50ක් මෙම කාර්යාලයේ තැන්පත් කිරීමෙන් හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් හෝ අනුමත කරන ලද ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ 1969 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 10.30 දක්වා පමණි.

මෙම කාර්යාලයෙන් සපයනු ලබන නියමිත ටෙන්ඩර් ෆෝර්ම වල ඉල්ලුම්කළ යුතු අතර ඒවා ලිපි කවරයක බහා සීල් තබා 1969 අගෝස්තු මස 31 වැනි දින දවල් 12ට පෙර මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ "ඉඩම් සංවර්ධන නිලධාරි, අනුරාධපුරය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කළ හැකිය. ටෙන්ඩර් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "............... ව්‍යාපාරයට ප්‍රාදේශීය ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය. සෑම ඉල්ලුම්කරුවෙකුම ඔහුගේ නම සහ ලිපිනය කවරයේ වම් කෙළවරේ පහත සඳහන් කළ යුතුයි.

1969 අගෝස්තු මස 31 වැනි දින පස්වරු 2.30ට අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි විසින් ඉඩම් සංවර්ධන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට පැමිණ සිටිය හැක.

පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් ඒ බව දන්වා සතියක් ඇතුළත අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරි සමග පොරොන්දුවකට බැඳිය යුතු අතර, ඔහු විසින් කරනු ලබන ඇණවුම් වලට අනුව දන්වන දිනයේ සිට සති දෙකක් ඇතුළත උපකරණ සැපයීමට හැකි විය යුතුයි. මෙම කාලය ඇතුළත පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ ද්‍රව්‍ය සැපයීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුවන්ගේ නම් කොන්දේසි කඩකළ ටෙන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට සුදුසුවන අතර, තැන්පත් මුදල ද රජය සතු කිරීමට ඉඩ තිබේ. තවද, වැඩි විස්තර අනුරාධපුර ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් දැනගත හැකිය.

එන්. බී. එප්. භාරතී,
ඉඩම් සංවර්ධන නිලධාරි,
අනුරාධරපුය.

1969ක් වූ ජූලි මස 25 වැනි දින,
අනුරාධපුර ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

8–357—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## සිමෙන්ති අලෙවි කිරීම

සිමෙන්ති උර 141 ක් (එකසිය හතලිස් එකක්) අලෙවි කිරීම සඳහා ටෙන්ඩර් අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ. සෑම ටෙන්ඩර් අයදුම් පතක්ම පිටපත් දෙකකින් යුක්තවිය යුතු අතර ඒවා ඉදිරිපත්කළ යුත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. කච්චේරියක රු. 25/-ක් (රුපියල් විසිපහක්) තැන්පත්කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත්කළ යුතුය.

2. ටෙන්ඩර් පත්‍ර අත්සන්කොට, දින යොදා, සීල් තබන ලද කවරවල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගේ නමට යැවිය යුතුය. ටෙන්ඩර් බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙලවරේ "සිමෙන්ති අලෙවි කිරීම සඳහා ටෙන්ඩර් අයදුම් පත්" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් අයදුම් පත් ලියා පදිංචි තැපැලෙන් මෙම කාර්යාලයට එවීමට පුළුවන. එසේ නැත්නම් ඒවා මේ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. 1969. 8. 24 වෙනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් අයදුම් පත් භාරගනු ලැබේ. 1969.8.24 වෙනි දින ප. ව. 2.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

3. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් අයදුම් පතක් හෝ සියලුම ටෙන්ඩර් අයදුම් පත් ප්‍රතික්ෂේප කිරීමේ බලය රජයට ඇත.

4. සාර්ථකවූ ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු කෙටි කලීන දැන්වීමකින් පසු සිමෙන්ති තොගය ඉවත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

5. වැඩි විස්තර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජනසේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබා ගැනීමට පුළුවන.

සී. ඒප් බාලචන්ද්‍ර,
ගොවිජනසේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

ගොවිජනසේවා සහකාර කොමසාරිස් කාර්යාලය,
කුරුණෑගල දිස්ත්‍රික්කය,
1969.7.26.

8–352—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරිකර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිව ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සෑම ටෙන්ඩර පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කුරුණෑගල දිසිත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ ඒ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969.8.23 වන දින දවල් 12 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින්ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක් ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4.ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවර වල බහා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "...................................සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1969.8.24 වන දින දවල් 12 ට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නොඑසේනම්, ඒ සඳහා මේ කායඞාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒබව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම්දීම නිකුත් කළ දිනසිට, දසදිනක් ඇතුලත දී එම ටෙන් ඩර්කරු විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසා රිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදයක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන් ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත්වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාක්කරුවන්ගේ නාම ලේඛන යට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කායඞා ලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කායඞාලීය වේලාවන් තුලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරා වෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරිතැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් නිලධාරියෙකු විසින් 1969.8.24 වෙනි දින ප.ව. 2.30 ට ටෙන්ඩර් විවෘත කරනඅවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන් ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවෙකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඩී. එෆ්. බාලචන්ද්‍ර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කුරුණෑගල දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා සහකාර කොමසාරිස් කායඞාලය,
කුරුණෑගල දිස්ත්‍රික්කය,
1969.7.26.

## වැඩ ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| 1. | බෝයගනේ අමුණ | ... අමුණ බැඳීම | ... වැ.වි.හ.ප. |
| 2. | කිරිබත්ගල්ල අමුණ | ... එම | ... එම |
| 3. | අහුගොඩ අමුණ | ... එම | ... එම |
| 4. | ගැට්ටුවාන අමුණ | ... එම | ... එම |
| 5. | පැල්ලන් කුඹුරේ අමුණ | ... එම | ... එම |
| 6. | කොටාදළුපොත අමුණ | ... එම | ... එම |
| 7. | සැවැන්දර කුඹුර | ... වාන බැඳීම | ... එම |
| 8. | මූකලානේ වැව | ... දියුණු කිරීම | ... එම |
| 9. | රාවනා වැව | ... අමුන බැඳීම | ... ද.දෙ.හ.ප. |
| 10. | රත්මල්ගොඩ අමුණ | ... එම | ... එම |
| 11. | අංකේවෙල අමුණ | ... පාර සෑදීම | ... එම |
| 12. | ගම්මන වෙල්යාය ඇල | ... දියුණු කිරීම | ... එම |
| 13. | බෝගහඇල අමුණ | ... අමුණ බැඳීම | ... එම |
| 14. | බඩල්වැව | ... දියුණු කිරීම | ... හි.හ.ප. |
| 15. | උල්පත් අංගේ වැව | ... එම | ... එම |
| 16. | මුන්හේන වැව | ... එම | ... එම |
| 17. | පොහොරවත්ත වැව | ... එම | ... එම |
| 18. | තරණගොල්ල වැව | ... එම | ... එම |
| 19. | නිකවැව | ... එම | ... එම |
| 20. | කලවාන වැව | ... එම | ... එම |
| 21. | දෙරවේරුව වැව | ... එම | ... එම |
| 22. | බටවැව | ... එම | ... එම |
| 23. | කල්ලන්චිය වැව | ... එම | ... ව.හ.ප. |
| 24. | පලුගහවැව | ... කඩ බැඳීම | ... එම |
| 25. | දූතව වැව | ... අළුත්වැඩියාව | ... එම |
| 26. | පත්තිනිගම වැව | ... දියුණු කිරීම | ... එම |
| 27. | පහල කුඩාවැව | ... එම | ... එම |
| 28. | කප්පරවල්ලිය වැව | ... එම | ... එම |
| 29. | විලව මහ වැව | ... එම | ... එම |
| 30. | කඩවලේ වැව | ... එම | ... එම |
| 31. | ඇත්තොට වැව | ... එම | ... ක.හ.ප. |
| 32. | කරුවල ගහ වැව | ... කඩ බැඳීම | ... එම |
| 33. | බෝගහමුල්ල වැව | ... දියුණු කිරීම | ... එම |
| 34. | මයිලගහ අමුණ | ... අමුණ බැඳීම | ... දෙ.හ.ප. |
| 35. | ගෙදරගාව වැව | ... දියුණු කිරීම | ... ක.හ.ප. |
| 36. | කණුකැටේ වැව | ... බැම්ම බැඳීම | ... දෙ.හ.ප. |
| 37. | පොතුපිටිය වැව | ... දියුණු කිරීම | ... එම |
| 38. | දිවුල්වැව මහවැව | ... එම | ... එම |
| 39. | ආරච්චිගම පහලවැව | ... එම | ... එම |
| 40. | නෙළුම් වැව | ... එම | ... එම |
| 41. | බයව අමුණ | ... අමුණ බැඳීම | ... එම |
| 42. | මැදගම වැව | ... දියුණු කිරීම | ... එම |
| 43. | ඉදිහේන මහවැව | ... එම | ... එම |
| 44. | ගලට බැඳි වැව | ... එම | ... එම |
| 45. | බෝගොඩ වැව | ... එම | ... එම |
| 46. | පොල්මොට්ටාව වැව | ... එම | ... එම |
| 47. | මිරිහන්පිටිය අමුණ වැව | ... එම | ... එම |
| 48. | මීවද්දන මහවැව | ... එම | ... එම |
| 49. | අමුණුකුඩුවේ අමුණ | ... අමුණ බැඳීම | ... එම |
| 50. | වලකුඹුරමුල්ල ඇල | ... ඇල ශුද්ධකිරීම | ... ක.හ.ප. |
| 51. | උඩවෙලයාය බැම්ම | ... බැම්ම බැඳීම | ... එම |
| 52. | ඊරියගොල්ලයාය බැම්ම | ... එම | ... එම |
| 53. | පිංවත්ත බැම්ම | ... එම | ... එම |
| 54. | සිරිගල බැම්ම | ... එම | ... එම |
| 55. | දෙරබඩගම රෙගුලේටරය | ... රෙගුලේටරය සෑදීම... | එම |
| 56. | හුංගාවෙල බැම්ම | ... බැම්ම බැඳීම | ... එම |
| 57. | මාවෙල බැම්ම | ... එම | ... එම |
| 58. | මහ නාවාන බැම්ම | ... එම | ... එම |

8–327—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්තය සඳහා ටෙන්ඩර් කැඳවීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මාලියද්ද උඩරාවේ ඇළ ප්‍රතිසංස්කරණය.

(2) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ රූපහ කිතුල්පාගම ඇළ ප්‍රතිසංස්කරණය.

(3) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පල්ලේගම පේඩිවෙල ඇළ ප්‍රතිසංස්කරණය.

(4) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ යටිමාදූර උරතපාන ඇළ ප්‍රතිසංස්කරණය.

(5) වලපනේ ප්‍රා ආ. නි. කොට්ඨාශයේ යටිමාදූර අන්ගම්මලුවෙ ඇළ ප්‍රතිසංස්කරණය.

(6) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ පේඩිගම එරාවුල්ල ඇළ ප්‍රතිසංස්කරණය.

(7) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ කුඹුක්වෙල ගන්තිලේ ඇළ ප්‍රතිසංස්කරණය.

(8) වලපනේ ප්‍රා ආ. නි. කොට්ඨාශයේ කුඹල්ගමුව කොට්ටවත්ත ඇළ ප්‍රතිසංස්කරණය.

(9) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ සැරසුන්තැන්න වැල්ල වත්ත ඇළ ප්‍රතිසංස්කරණය.

(10) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ කැටකදූර උණගොල්ල ඇළ ප්‍රතිසංස්කරණය.

(11) වලපනේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ දූලිවෙල බටතොටකදූර ඇළ ප්‍රතිසංස්කරණය.

(12) කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මැතගම දෙල්වත්ත ඇළ ප්‍රතිසංස්කරණය.

(13) කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මඩකුඹුර නායේ ඇළ නොහොත් මහ කන්ද කුඹුර ඇල ප්‍රතිසංස්කරණය.

(14) කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ රාවණාගොඩ විජයබාහු කන්ද දහනැක්කේ ඇළ ප්‍රතිසංස්කරණය.

(15) කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ මඩකුඹුර උඩුකුඹුර වත්ත ඇළ නොහොත් මඩකුඹුරවත්ත ඇළ ප්‍රතිසංස්කරණය.

(16) කොත්මලේ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ නියන්ගන්දොර පන්හල්ඔය ඇළ ප්‍රතිසංස්කරණය.

(17) උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ බෝවල බණ්ඩාර ඇළ ප්‍රතිසංස්කරණය.

(18) උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ බමරගම දෙල්පත්කඩ ඇළ ප්‍රතිසංස්කරණය.

(19) උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ හපුවල අඹලියද්ද මැදිරිය පිහිල්ල ඇළ ප්‍රතිසංස්කරණය

(20) උඩහේවාහැට ප්‍රා ආ. නි. කොට්ඨාශයේ හපුවෙල මැදවෙල අමුණ ප්‍රතිසංස්කරණය.

(21) උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ විල්වල පුන්ඩරුඅරාවේ ඇළ ප්‍රතිසංස්කරණය.

(22) උඩහේවාහැට ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ වැල්ලගිරිය හීනටිවෙල මහඇළ ප්‍රතිසංස්කරණය.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 අගෝස්තු මස 19 දින දවල් 12 දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "......සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 අගෝස්තු මස 21 වෙනි දින දවල් 12ට පෙර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියේට 5ක් ටෙන්ඩර්කරු විසින් (5%) තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුල්වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලයීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් වියයුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අගෝස්තු මස 22 වෙනි දින පෙ. ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඇස්. සී. එච්. සුපියරත්න,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජූලි මස 29 දින දීය.

8–543—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවුන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂාකර බැලීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන්කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්වහොත් හෝ ඔහු අතටම භාර දුන්නාසේ සලකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥාපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

16. කිසියම් සේවකයෙකු සේවයේ යෙදීමට අහිතකර යයි රජය සලකනු ලබන විටක හා කිසියම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීමට විරුද්ධවීමේ අයිතිය රජය සතුවේ.

17. නානි වශයෙන් හෝ වෙනත් අයෙකුගේ නමක් සමඟ රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙහි නම් සඳහන් කිසිවෙකු සමඟ හෝ තමාට සැඟේ යයි හැඟී යන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. එකී එකී ගොවිපලවල කළමනාකරුවන්ගෙන් මේ සම්බන්ධ වැඩි විස්තර ලබාගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්).

69.7.25,
පේරාදෙණියේදීය.

8–351—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි වාහන සහ වාහන කොටස් විකිණීම

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි වාහන, වාහන කොටස් සහ බැටරි විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. මේවා 1969 8.31 දින දක්වා, බොරැල්ලේ, කාසල් වීදියේ, අංක 100 දරණ ස්ථානයේ පිහිටි ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩා අංශයේ දී පරීක්ෂා කර බැලීමට පුළුවන.

1. සී. ජේ. 6 වර්ගයේ අංක 4 ශ්‍රී 1844 දරණ විලීස් ජීප් රථය.
2. ජේ. 20 වර්ගයේ අංක 4 ශ්‍රී 9860 දරණ විලීස් ජීප් රථය.
3. අංක 55 ශ්‍රී 1236 දරණ ට්‍රේලරය.
4. අංක 55 ශ්‍රී 1356 දරණ ට්‍රේලරය.
5. මෝටර් වාහන උපකරණ ගොඩක්.
6. පරණ බැටරි 93 ක්.

2. ටෙන්ඩර්කරුවන් විසින් පිළියෙල කරගන්නා ලද ටෙන්ඩර් පෝර්මයන්හි පිටපත් දෙකකින් යුතුව ඉහත සඳහන් විෂයයන් 6 සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුයි. තවද, වාහන යකට රු. 100 බැගින් සහ වාහන කොටස් සහ බැටරි සඳහා රු. 25 බැගින්ද වනසේ ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීම පිළිබඳ රිසිට් පත්‍ර මෙම ටෙන්ඩර්පත්වලට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල කච්චේරිවල හෝ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර්පත් 1969 සැප්තැම්බර් මස 1 වැනි දින පස්වරු 2 ට පෙර කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන ලෙස ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් ඇතුළත් ලියුම් කවරයේ වම් කෙළවර මුදුනේ "පරණ වාහන හෝ වාහන කොටස් මිළ දී ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත වේලාවට පළමු සීල් තබන ලද ටෙන්ඩර්පත් පරණ මහ ලේකම් කාර්යාලයේ තුන්වන මහලේ අංක 357 දරණ කාමරයේ තබා ඇති පෙට්ටියේ බහාලිය හැක.

4. ටෙන්ඩර්පත් ඉහත සඳහන් කාමරයේ දී 1969.9.1 වැනි දින සවස 2.15 ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගෙන් බලය ලත් නියෝජිතවරුනට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

5. වාහන විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් භාරගත් බව දැනුම් දී සතියක් ඇතුළත දී, ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලුම් කරන ලද මුදල් ගෙවා වාහන හෝ කොටස් වහාම ඉවත්කර ගත යුතුය.

6. නියමිත කාලයේදී නියමිත මුදල සම්පූර්ණයෙන් ගෙවා වාහන හෝ වාහන කොටස් ඉවත් කර ගැනීමට යම්කිසි ටෙන්ඩර්කරුවකු අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල අහිමි වීමට මෙන්ම රජය විසින් හිමිකම් පාන ඕනෑම දෙයක් සම්බන්ධයෙන් අවශ්‍යයක් නොවන පරිද්දෙන් ඔහුගේ නම කොන්දේසි කඩ කළ ටෙන්ඩර්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

එච්. ආර්. අමිට්,
අතිරේක ඉඩම් කොමසාරිස්.

ඉඩම් කොමසාරිස් කාර්යාලය,
කොළඹ, 1969 ජූලි 30 දින.

8–495—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### කොළඹ 1, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය දීර්ඝ කළ කොටසෙහි විදුලි ස්ථාපනය

ඉහත සඳහන් සේවය සඳහා 69.8.22 වන දින පෙරවරු 11 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 69.8.21 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ බැහැර කච්චේරියක රු. 25ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහලූ ලියුම් කවරයේ කෙළවරේ "ඉ.සං.දෙ. ප්‍රධාන කාර්යාලයේ දීර්ඝකළ කොටසෙහි විදුලි ස්ථාපනය සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන්කොට, කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර්

විවෘත කළ දින සිට දින 60ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට මසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දන්වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නම ද රජයේ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ එවිලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 69.8.22 වන දින පෙ. ව. 11ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් විසින් මෙවැනි වැඩ සඳහා ඔවුන්ගේ පළපුරුදුකම් හා දක්ෂතාව ටෙන්ඩර් පෝරම ඉල්ලීමේදී ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතු වේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීපී/2/384

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එවිලින් චතුරශ්‍රය, කොළඹ, 69.7.31.

8–511—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

1969 ඔක්තෝබර් 1 දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා (දෙදිනම ඇතුළත්ව) කාලය තුළ වත්තේගම අන්ධයින් පුනරුත්ථාපනය හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ කිළිටි රෙදි පිරිසිදු කිරීමේ කාර්ය සඳහා ටෙන්ඩර් පහත අත්සන් තබා ඇති අය විසින් 1969. 8. 25 දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයේ හෝ කච්චේරියක රු. 25 ක මුදලක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය.

3. තැපැල් මගින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරන්නවුන් එසේ එම ආකෘති පත්‍ර ලබා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකිවන අයුරු තැන්පත් මුදල් කුවිතාන්සි සෑහෙන තරම් කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබා ලියුම් කවරයේ ඉහළ වම් පැත්තේ "කිළිටි රෙදි පිරිසිදු කිරීමේ ටෙන්ඩර්" යන්න සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් "සමාජ සේවා අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 577, කොළඹ 3" යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට අදහස් නොකරන ටෙන්ඩර්කරුවන්ට එම ටෙන්ඩර් පත් කොළඹ 3, ගාලු මුවදෙර බාලදක්ෂ මාවතේ සමාජසේවා දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ටෙන්ඩර් පත්‍ර තැන්පත් කිරීම සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ටෙන්ඩර් පත්‍ර බහාලූ කවර මත සටහන් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍රවල මිළ ගණන් ඉලක්කම්වලින් මෙන්ම වචනයෙන් ද පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. පිළිගත් ටෙන්ඩර් හිමිකරු ගිවිසුමට බැඳී කොන්ත්‍රාත්තුවේ වැඩ පටන් ගැනීමට කලින් මුදලින් රුපියල් පණහක (රු. 50) ඇපයක් තැබිය යුතුය. කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටුකොට අවසාන වූ පසු ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

7. කිසියම් ටෙන්ඩර්කරුවෙකු ඔහුගේ ටෙන්ඩරය පිළිගෙන ඇති බව දන්වනු ලැබූ විට කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියොත් හෝ ඇප තැබීම නියම කළ විට එසේ කිරීම පැහැර හැරියොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ඔහුට අහිමි වන්නේ ය.

8. තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ 7 වන ඡෙදයේ කොන්දේසිවලට යටත්වය.

9. ටෙන්ඩර් පියවීමේ වේලාව අවසන්වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ටද පෙනී සිටිය හැක.

10. වැඩිදුරටත් විස්තර අවශ්‍ය වෙතොත් කොළඹ 3, තැපැල් පෙට්ටිය 577, සමාජ සේවා අධ්‍යක්ෂතැනගේ කායභීලයෙන් ලබාගත හැක.

අ. ම. මූ. සහබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ, තැ. පෙ. 577, බාලදක්ෂ මාවතේ පිහිටි
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

8–442—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

1969 ඔක්තෝබර් 1 දින සිට 1970 සැප්තැම්බර් 30 දින දක්වා (දෙදිනම ඇතුළත්ව) කාලය තුළ වත්තේගම අන්ධයින් පුනරුත්ථාපනය හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයට පාන් සහ රස කැවිලි සැපයීමේ කාර්ය සඳහා ටෙන්ඩර් පහත අත්සන් තබා ඇති අය විසින් 1969.8.25 දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ මෙම කාර්යාලයේ හෝ කච්චේරියක රු. 25 ක මුදලක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය.

3. තැපැල් මගින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරන්නවුන් එසේ එම ආකෘති පත්‍ර ලබා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකිවන අයුරු තැන්පත් මුදල් කුවිතාන්සි සෑහෙන තරම් කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර මුද්‍රා තබා ලියුම් කවරයේ ඉහළ වම් පැත්තේ පාන් සහ රසකැවිලි සැපයීමේ ටෙන්ඩර්" යන්න සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් "සමාජ සේවා අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, තැ. පෙ. 577, කොළඹ 3" යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට අදහස් නොකරන ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත් කොළඹ 3, ගාලු මුවදොර, බාලදක්ෂ මාවතේ සමාජ සේවා දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ටෙන්ඩර් පත්‍ර තැන්පත් කිරීම සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ හැකිය. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරය මත සටහන් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍රවල මිළ ගණන් ඉලක්කම්වලින් මෙන්ම වචනයෙන් ද පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. පිළිගත් ටෙන්ඩර් හිමිකරු ගිවිසුමට බැඳී කොන්ත්‍රාත්තුවේ වැඩ අටන් ගැනීමට කලින් මුදලින් රුපියල් සියයක (100) ඇපයක් තැබිය යුතුය. කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටුකොට අවසාන වූ පසු ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

7. කිසියම් ටෙන්ඩර්කරුවෙකු ඔහුගේ ටෙන්ඩරය පිළිගෙන ඇති බව දන්වනු ලැබූ විට කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියොත් හෝ ඇප තැබීම නියම කළ විට එසේ කිරීම පැහැර හැරියොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ඔහුට අහිමි වන්නේ ය.

8. තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ 7 වන ඡෙදයේ කොන්දේසිවලට යටත්වය.

9. ටෙන්ඩර් පියවීමේ වේලාව අවසන්වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. එවිට ටෙන්ඩර්කරුවන්ටද පෙනී සිටිය හැක.

10. වැඩිදුරටත් විස්තර අවශ්‍ය වෙතොත් කොළඹ 3, තැපැල් පෙට්ටිය 577, සමාජ සේවා අධ්‍යක්ෂතැනගේ කායභීලයෙන් ලබාගත හැක.

අ. ම. මූ. සහබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ, තැ. පෙ. 577, බාලදක්ෂ මාවතේ පිහිටි
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

8–443—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434 රේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් තෙලිපිල්ලෙයි, කන්කසන්තුරේ නව ආරෝග්‍යශාලාවේ ජල සම්පාදනය ඉදිකිරීම පිණිස අවශ්‍ය පොම්ප සම්පාදනය සහ සවිකිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 2 වැනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

කොළඹ 7 පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී කවරයේ වම්පස ඉහළ කොටසේ, "පොම්ප සඳහා ටෙන්ඩර් කැඳවීම, තෙලිපිල්ලෙයි, කන්කසන්තුරේ නව රෝහල" යන්න සඳහන් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින්, 1969 අගෝස්තු මස 22 වැනි සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලැබේ. මෙය විශේෂයෙන් බලපානුයේ පොම්ප සපයන වෙළඳ සමාගම් සහ විශේෂයෙන් මෑතක් වනතෙක් රජයේ දෙපාර්තමේන්තුවල මේ සම්බන්ධව සාර්ථක අන්දමින් ඒ වැඩ කළ අය සඳහා ද වෙයි.

එස්. ඊ. ජේ. මේතර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු.

1969 ජූලි මස 26 වැනි දින,
තැපැල් පෙට්ටිය 1434,
කොළඹ 7.

8-386—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 30 වැනි දා ප. ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. ගා/මීපෙ ශ්‍රී විජය කණිෂ්ඨ විද්‍යාලය | ගොඩනැගිල්ල |
| 2. ගා/කලුවලගල කණිෂ්ඨ විද්‍යාලය | ගුරු නිවාසය |
| 3. ගා/තොටගමුව මහා විද්‍යාලය | ගොඩනැගිල්ල |
| 4. ගා/සීනිගම මහා විද්‍යාලය | ගොඩනැගිල්ල |
| 5. ගා/කැටන්දෙල කණිෂ්ඨ විද්‍යාලය | ගොඩනැගිල්ල |
| 6. ගා/කොටගොඩ කණිෂ්ඨ විද්‍යාලය | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 7. ගා/බටදූව මහා විද්‍යාලය | ගොඩනැගිල්ල |
| 8. ගා/කදිරගොන්න කණිෂ්ඨ විද්‍යාලය | ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| 9. ගා/ගනේගම බෞද්ධ විද්‍යාලය | ගොඩනැගිලි අළුත්වැඩියාව |
| 10. ගා/වේරගොඩ මහා විද්‍යාලය | විද්‍යාගාරයේ ඉතිරි වැඩ |

සංලක්ෂ්‍යය—ගා/=ගාලු දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායභාලයයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සහ 2 සඳහා රු. 18,000, වැඩ අංක 3, 4, 5, 6 සහ 7 සඳහා රු. 15,000 වැඩ අංක 8, 9 සහ 10 සඳහා රු. 10,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1969 අගෝස්තු මස 29 වැනි දා දවල් 12.00 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුසෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිට පත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් ගාල්ල ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අගෝස්තු මස 30 වැනි දා ප. ව. 2.30 ට ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතු යි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායභාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත් නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඊ. විජිත අබේසේකර,
ගාලු ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 30 වෙනි දින,
ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ දීය.

8-428—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 29 වෙනි දින ප. ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ සවභාවය |
|---|---|
| අ/හොරොව්පොතාන මහා විද්‍යාලය | වාණිජ විද්‍යා ගොඩනැගිල්ල තැනීම |

සංලක්ෂ්‍යය.—අ=අනුරාධපුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 20,000 ට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අගෝස්තු මස 28 දා පෙ. ව. 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුසෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

3. දෙවෙනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ

හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය. ඔවුන් දෙවෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වෙනි හා 3 වෙනි ඡේදවල සඳහන් පරිදි අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අගෝස්තු මස 29 වැනිදා ප. ව. 2.30 ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වෙතොත් අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. ගුණසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
අනුරාධපුර.

1969 ජූලි මස 29 වැනිදා,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ දීය.

8–434—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 29 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | වැඩෙහි ස්වභාවය |
|---|---|---|
| (1) | කු/කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලය | ගරාජය ආදිය |
| (2) | කු/මූදුන්න මහා විද්‍යාලය | ගුරු නිවාසය |
| (3) | කු/නක්කාවත්ත මහා විද්‍යාලය | වාණිජ විද්‍යාගාරය |
| (4) | කු/ශාන්ත බර්නාදෙත් මහා විද්‍යාලය | වාණිජ විද්‍යාගාරය |
| (5) | කු/මකුල්පොත විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ල |
| (6) | කු/තම්මිට විද්‍යාලය | ගුරු නිවාසය |
| (7) | කු/කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ල |
| (8) | කු/රම්බඩගල්ල මහා විද්‍යාලය | වහල අලුත්වැඩියාව |
| (9) | කු/ගනේගම විද්‍යාලය | වහල අලුත්වැඩියාව |
| (10) | කු/අලවල විද්‍යාලය | වහල අලුත්වැඩියාව. |

**සංලක්ෂය : කු/කුරුණෑගල දිස්ත්‍රික්කය**

කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායසීලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්.

අංක 1 සිට 2 දක්වා රු. 25,000 හෝ ඊට වැඩි ගණනකට

අංක 3 සිට 5 දක්වා රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට

අංක 6 සිට 7 දක්වා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට

අංක 8 සිට 10 දක්වා රු. 10,000 හෝ ඊට වැඩි ගණනකට.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අගෝස්තු මස 28 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ පාලන සහකාර වෙත භාරදිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1969 අගෝස්තු මස 29 වැනිදා පෙරවරු 10.30 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක
කුරුණෑගල වැඩබලන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ

1969 ජූලි මස 29 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී ය.

8–381—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 අගෝස්තු මස 29 වෙනි සිකුරාදා පස්වරු 2.30 වනතෙක් මෙහි පහත සඳහන් කාර්ය සඳහා ටෙන්ඩර් පත්‍ර මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
| --- | --- |
| හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය—අම්පාර. | පන්ති කාමර දෙකක් ගොඩනැගීම |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මඩකලපුව ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 40,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 අගෝස්තු 28 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවෝ ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මඩකලපුවේ අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවෙනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිති වලටද, ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මඩකලපුව, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහු ගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය ලබා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මඩකලපුව අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරි වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 අගෝස්තු 29 වැනි සිකුරාදා පස්වරු 2.30ට මඩකලපුවේ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩරය විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර ඇතොත් මඩකලපුව, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක.

8. ටෙන්ඩර් පත් නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. සංගරලිංගම්,
නැගෙනහිර ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969.7.31 දින,
මඩකලපුව,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

8-510—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන කාර්යාලය—ගම්පහ

**කොළඹ උතුර ප්‍රදේශයේ පාසල්වලට කිරි බිස්කෝතු ගෙන යාම**

මෙහි පහත දැක්වෙන සේවාවන් සඳහා සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

රත්මලානේ මැලිබන් බිස්කෝතු නිෂ්පාදන ස්ථානයේ සිට හෝ කොට්ටාව, හයිලෙවල් පාරේ පිහිටි සීමාසහිත සිලෝන් බිස්කට් සමාගමේ සිට කාඩ්බෝඩ් පෙට්ටිවල අසුරන ලද බිස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි (ඡන්ද කොට්ඨාශයන්හි) පිහිටි පාසැල් වෙත ප්‍රවාහණය කිරීම.

සඳහන් කරන ලද මණ්ඩල (ඡන්ද කොට්ඨාශ) මෙපරිදිය :—

(1) දොම්පෙ
(2) කටාන
(3) ගම්පහ
(4) මහර
(5) අත්තනගල්ල
(6) ජාඇල
(7) වත්තල
(8) මීරිගම
(9) කැලණිය
(10) දිවුලපිටිය
(11) මිණුවන්ගොඩ
(12) මීගමුව.

ඉහත සඳහන් සේවය සඳහා සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අගෝස්තු මස 23 වැනි සෙනසුරාදා පෙරවරු 10.30 තෙක් භාරගනු ලැබේ.

ගම්පහ අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළයුතු වේ.

ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීමට පෙර රුපියල් 100ක තැන්පත් මුදලක් ගම්පහ අධ්‍යාපන කාර්යාලයේ තැන්පත්කොට කුවිතාන්සියක් ලබාගත් අයට 1969 අගෝස්තු මස 21 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම් එකී මුදල තැන්පත් කිරිම අනවශ්‍යය.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් ගම්පහ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් දහ දහක් වටිනා දේපළ ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් හා ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරනලද 1969 වර්ෂයට බලපත්‍ර යක් ලබාගත් එක් ලොරියක්වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අනුමත කරනලද සමුපකාර සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට කලින් ගම්පහ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස්තුමාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථායෝග්‍ය පරිදි ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

ගම්පහ (කොළඹ උතුර) ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම් පත් ලැබී සතියක් ඇතුලත පාසැල්වලට බිස්කෝතු ගෙනගොස් භාරදීම කළ යුතු වේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමේ හෝ එහි කොටසක් පමණක් භාරගැනීමේ හෝ අයිතිය ඒ ඒ ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති 6ක් කල්දිය යුතුය. ටෙන්ඩරය පිළිබඳ සියළුම කොන්දේසි හා වෙනත් විස්තර ගම්පහ අධ්‍යාපන කාර්යාල යෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. ඒ. ජේ. ඩබ්ලිව්. ජයතිලක,
කොළ/ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූලි මස 25 වෙනි දින,
ගම්පහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

8–364—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් මස 1 වෙනි සඳුදා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට අයිති ප්‍රයෝජනයට ගත නොහැකි ටයිප් රයිටර් 7 ක්, එකතු කිරීමේ යන්ත්‍ර 2 ක්, fපයර් පම්ප් 2 ක්, රාත්තල් 45 fෆාමයිට් ටින් 222, ඇන්ජිම සහිත ඩෙනිස් පොම්පයක්, අලවංගු, කැති, මිටි, බේසන්, බයිසිකල් උපකරණ, පීරි, කිමිදුම් කරුවන්ගේ ඇඳුම් උපකරණ, මේස විදුලි පංකා, විවිධ වර්ගයේ ලන්තෑරුම්, ස්පැනර්, ෂවල, බාල්දි ආදී වෙනත් විවිධ ආම්පන්න තොග කිහිපයක් හා ගැලුම් 45 බැරල් 225 ක් විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 1 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර්පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර්පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කායඝීලයේ දී පරීක්ෂා කළ හැක. රු. 200 මුදලක් වරාය කොමිෂන් සභා කායඝීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1969 අගෝස්තු මස 29 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1969. 7. 31.

8–504—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ස්වයං ධාවන මඩහාරන යාත්‍රාවක් සැපයීමේ ටෙන්ඩරය

කොළඹ වරාය කොමිෂන් සභාවට ස්වයං ධාවන මඩ හාරන යාත්‍රාවක් සැපයීම පිළිබඳ 1969. 6. 13 වෙනි දින අංක 14,858 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 6-376 දරණ නිවේදනය සම්බන්ධවයි.

මෙම ටෙන්ඩරය විවෘත කරන දිනය හා වේලාව 69.9.27 වෙනි දින පෙ. ව. 10 වන තෙක් හා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරන දිනය 69. 9. 24 වෙනි දින තෙක් දීර්ඝ කළ බව මෙයින් දැනුම් දෙමි.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1969. 7. 29 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දීය.

8–503—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට දෙවර්ෂයක කාල සීමාව තුළ මෙහි පහතින් සඳහන් දුම්රිය ස්ථානවල බඩු බෑම සහ පැටවීම සඳහා ලියාපදිංචි කළ ටෙන්ඩර්කරුවන්ගෙන් 1969 අගෝස්තු මස 31 වෙනි ඉරිදා, පෙ. ව. 10 දක්වා කොළඹ තැ. පෙ. අංක 355 දරන ලංකා දුම්රිය සේවයේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| | |
|---|---|
| 1. මාතර | 10. වත්තේගම |
| 2. ගාල්ල | 11. මාතලේ |
| 3. පොල්ගහවෙල | 12. හැටන් |
| 4. කුරුණෑගල | 13. තලවාකැලේ |
| 5. මහව | 14. වටගොඩ |
| 6. මඩකලපුව | 15. නානුඔය |
| 7. යාපනය | 16. හපුතලේ |
| 8. රඹුක්කන | 17. බණ්ඩාරවෙල |
| 9. සරසවිඋයන | 18. බදුල්ල |

2. මෙතෙක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ මේ සම්බන්ධව සැලකිලිමත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ නාමයන් ලියාපදිංචි කරන ලෙස ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරී වෙත පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමින් 1969 අගෝස්තු 23 වෙනි සෙනසුරාදා හෝ ඊට ප්‍රථම අයදුම් කළ යුතුයි.

(අ) මෙම වගීයේ ව්‍යාපාර ගැන කලින් ඇති පළපුරුද්ද සම්බන්ධව විස්තර සහිත ප්‍රකාශයක්ද පෙර පළපුරුද්ද කාර්යක්ෂම සහ මුදල් ස්ථාවරත්වය පිළිබඳව මහා භාණ්ඩාගාර චක්‍ර ලේඛණ 1085ඊ/282/2 ඒ හා 1961. 5. 26 අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉටු කරන ලද රජයේ කොන්ත්‍රාත්තු දැක්වෙන ප්‍රකාශයක් සහ එහි විස්තර.

(ඇ) සතු ඉඩකඩම් දේපල හා වෙනත් ව්‍යාපාර සම්බන්ධකම්ද, එය පිහිටි දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්කද දැක්වෙන සම්පූර්ණ විස්තර සහිත ප්‍රකාශයක් සහ

(ඈ) රජයේ කොන්ත්‍රාත්තු කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්තු කරුවන්ගේ නාම ලේඛනයට සිය නම් ඇතුළු වී නැති බවට ප්‍රකාශයක්.

3. කොළඹ තැ. පෙ. 355 දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබාගත යුතු ආකෘති පත්‍රවල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් සෑම සේවාවක් උදෙසාම රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලයේ හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 අගෝස්තු මස 30 වෙනි සෙනසුරාදා දවල් 12.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මෙම නිවේදනය සහ විස්තර ප්‍රකාශයද සමග ටෙන්ඩර් මුද්‍රා තබා කොළඹ 10, තැ. පෙ. 355 ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති නමට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එසේ නැත්නම් ලිපිනය සහ සේවය විස්තර කවරයේ සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාර ගැනීමට බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ පැමිණ භාර දී එය භාර ගත් බවට ඔවුන්ගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ නියමිත දිනය සහ වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එසේ කැමැත්තේ නම් ටෙන්ඩර්කරුවන්ටද එහි පෙනී සිටිය හැක. 1969 අගෝස්තු 31 වැනි ඉරිදා පෙ. ව. 10.30 ට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනයේ සිට ඉදිරියට සති 6 ක කාලයකට ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වැඩිපුර විස්තර වාණිජ අධිකාරීගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. අංකය : 355,
කොළඹ.
1969. 7. 31

8–492—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 වෙනි ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් දේශීය නිෂ්පාදිත තීන්ත සැපයීම සඳහා 1969 සැප්තැම්බර් 8 වෙනි දින පෙ. ව. 10.00 වන තෙක් සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝර්ම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. එම පෝර්ම කොළ ටෙන්ඩර් විවෘත කරන ඉහත සඳහන් දිනට පෙරදින දවල් 12.00 වනතෙක් මාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. මෙම පෝර්ම ලබාගැනීමට කොළඹ 5, කිරුළ පාරේ අංක 200, වෙනි ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත ටෙන්ඩර් සඳහා මුදලින් රු. 100 ක් තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර මගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

1969. 7. 23 දින.
200, කිරුළ පාර,
කොළඹ 5.

8–481—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

### වේරහැර, බොරලැස්ගමුවේ අපහරණ අංගනයේ තිබෙන අබලි බැටරි හා වෙනත් ද්‍රව්‍ය විකිණීම

වේරහැර, බොරලැස්ගමුවේ අපහරණ අංගනයේ තිබෙන අබලි බැටරි, රබර් ටියුබ්, ෆ්ලැප්, ගැලුම් 45 ප්‍රමාණයේ පීප්ප, බෝල රේසර්, පිත්තල, වාත්තු යකඩ, ඩ්‍රම්, රිම් සහ හබ්, බස් සීට් රාමු, හල් මිල්ල පිටපලු, වීදුරු දොරවල්, ආමෙචර් ඔතුන් කම්බි, හිස් බරණි, බෝතල්, මෝටර්, ෆෑන් යනාදිය ඇතුළත් තවත් ද්‍රව්‍ය මිළදී හැර ගෙන යාම සඳහා කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් 1969.8.31 වෙනි දින පෙ. ව. 10.00 වන තුරු මුද්‍රා තැබූ ටෙන්ඩර භාරගනු ලැබේ.

ටෙන්ඩර භාරගන්නා අවසාන දිනයට පෙර දින දහවල් 12.00 වන තුරු මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල පිටපත් දෙකකින් යුක්ත කොට සීල් තබා ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙන් සිටින ලංගම ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත මුදලින් අවශ්‍ය ටෙන්ඩර මුදල තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසුවය.

එකතුව රු. 5000 දක්වා ටෙන්ඩර මුදල් තැන්පත් කරන ටෙන්ඩර කරුවාට සියලුම තොග සඳහා ටෙන්ඩර ඉදිරිපත් කළ හැක.

වැඩ කරන සාමාන්‍ය කාලය තුළ බොරලැස්ගමුව, වේරහැර අපහරණ අංගනයේදී මෙම ද්‍රව්‍ය පරීක්ෂා කළ හැක. විකිණීමට ඇති ද්‍රව්‍ය සඳහා ලැයිස්තු හා ටෙන්ඩර තැන්පත් මුදල් පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන
වෙනුවට.

200, කිරුළ පාර,
කොළඹ 5.

8–530—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## මිළ ගණන් කැඳවීම

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට අයත් පහත විස්තර සඳහන් ලෑන්ඩ්රෝවර් සහ විලීස් ජීප් රථවල හුඩ් සෑදීම සහ ඇතුළත කුෂන් කිරීම සඳහා මෙයින් මිළ ගණන් කැඳවනු ලැබේ.

1. (අ) විල් බේස් 88" දරණ ලෑන්ඩ්රෝවර් රථ ... 5
   (ආ) විල් බේස් 109" දරණ ලෑන්ඩ්රෝවර් රථ ... 3
   (ඉ) විලීස් ජීප් රථ ... 2

2. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් ක්‍රමය අනුගමනය කළ යුතුයි.

(අ) දෙපාර්තමේන්තුව මගින් කැන්වස් රෙදි සපයන විට එක් වාහනයක් සඳහා ඉදිරිපත් කරන මිළ ගණන් සහ අවශ්‍ය රෙදි ප්‍රමාණය.

(ආ) ටෙන්ඩර්කරු විසින් කැන්වස් රෙදි සපයා ගන්නා විට ඉදිරිපත් කරන එක් වාහනයක් සඳහා මිළ ගණන්. (කැන්වස් රෙදිවල ආදර්ශ කැබලි (සාම්පල්ස්) ඉදිරිපත් කළ යුතුයි.)

(ඉ) මෙම වාහනවල හුඩ් එකේ ඇතුල් පැත්තේ සහ ආසන ඇතුළුව ඇතුල් පැත්තේ කුෂන් වැඩ සඳහා වෙනම මිළ ගණන් ඉදිරිපත් කළ යුතුයි. එසේම පාවිච්චි කිරීමට අදහස් කරන ද්‍රව්‍යවල ආදර්ශ කොටස් (සාම්පල්ස්) ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතුයි. තවද එක වාහනයක් කුෂන් කිරීමට රේට් ගණනද ඉදිරිපත් කළ යුතුයි.

3. මෙම වැඩය කිරීමට අවසර ලැබෙන ලිපිය ලැබී මාස 6 ක් තුළ සම්පූර්ණ වැඩය නිම කළ යුතුය. එසේම ඉහත සඳහන් වැඩය සඳහා ඉදිරිපත් කරන මිළ ගණන් වල වලංගු කාල සීමාවද සඳහන් කළ යුතුයි.

මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ජීප් රථවල හුඩ් සෑදීම සඳහා මිළ ගණන් යනුවෙන් කවරයේ වම් පැත්තේ ඉහල කෙළවරේ සඳහන් කළ යුතුයි. තවද එම මිළ ගණන් 1969 සැප්තැම්බර් 5 දින පෙ. ව. 10 ට පෙර ලැබෙන සේ කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ 5 වෙනි මහලෙහි, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු වෙත සීල් තැබූ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. එසේම එම මිළ ගණන් ඉහත සඳහන් කායර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේද බහාලිය හැක.

මිළ ගණන් එදිනම (1969.9.5) දින පෙ. ව. 10.30 ට විවෘත කරනු ලැබේ.
ඉල්ලුම්කරුවනට එම අවස්ථාවේදී පැමිණ සිටීමට පුළුවන.

වැඩි විස්තර අවශ්‍ය නම් කායර්‍යාල වේලාවන්හි (පෙ. ව. 10.30—ප. ව. 4) කොළඹ 10, මරදානෙහි තැපැල් සහ විදුලි සංදේශ ගබඩා වෙහි, ප්‍රවාහන නිලධාරී තැනගෙන් විමසීමට පුළුවන.

ජී. ටී. ද එස්. එල්ලාවල,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

5 වෙනි මහල,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

8–329—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය රත්මලාන

### මනුවන්ගම ඇබ පාලම—මුන්නේෂ්වරම් ග. ස.—හලාවත දිස්ත්‍රික්කය

හලාවත දිස්ත්‍රික්කයේ, මුන්නේෂ්වරම් ග. ස. ප්‍රදේශයේ මනුවන්ගම ඇබහරහා පෙරදැඩි කරන ලද සිමෙන්ති කොන්ක්‍රීට් පාළමක් නිර්මාණය කිරීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර, රත්මලානේ, ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1969 ක් වූ සැප්තැම්බර් මස 23 වන අඟහරුවාදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත එදිනම පස්වරු 2.35 ට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

2. මේ අංශයේ නිර්මාණ පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධ වූ සියලු විස්තර හා තොරතුරු ද ඉහත කී ඉංජිනේරුතැනගෙන් ලබාගත හැකි වන අතර මෙයට අදාළ සැලැස්ම ද ඔහුගේ කායර්‍යාලයේදී බලාගත හැකි වන්නේය.

3. රුපියල් දෙලක්ෂයකට අධික වියදම් සහිත මෙයට සමාන වැඩ කර ඇති බවට ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ඕනෑම පළාත් පාලන ආයතනයක ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුසු සන් වන්නේය. ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි හා ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් ඉහත කී ඉංජිනේරු තැන වෙත 1969 සැප්තැම්බර් මස 16 වන අඟහරුවාදා දහවල් 12 ට පෙරාතුව ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩ කර ඇති බවට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය එනතෙක් නො සිට හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
වැඩබලන අධ්‍යක්ෂ.

ජලසම්පාදන, ජලාපවහන හා
පළාත් පාලන වැඩ අංශය, රත්මලාන.
1969 ජූලි 29 වන දින.

8–524—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය.

## ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය රත්මලාන

(අ) ප්‍රත්‍යබල උපකරණ

(ආ) ටොන් 150 ක අති අත්‍යන්ත ප්‍රත්‍යබල වයර් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම.

පහත සඳහන් දෑ සැපයීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර, රත්මලානේ, ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1969ක්වූ සැප්තැම්බර් මස 8 වන දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

(අ) ප්‍රත්‍යබල උපකරණ.

(ආ) ටොන් 150 ක අති අත්‍යන්ත ප්‍රත්‍යබල වයර්.

ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන අය රත්මලානේ ජල සම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු (ක්‍රියාත්මක හා නඩත්තු) තැන වෙත එම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 250 ක මුදලක් තැන්පත් කළ බවට ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමේදී ටෙන්ඩර් ලිය කියවිලි නිකුත් කරනු ඇත. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරයේ කොන්දේසිවලට අනුකූලව ආපසු ගෙවනු ලැබේ.

ඉහත සඳහන් අයුරින් ලබාගත් ටෙන්ඩර් ආකෘති පත්‍රයකින් ටෙන්ඩර් කළ යුතුය. 1969 අගෝස්තු 30 වන දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

ජලසම්පාදන, ජලාපවහන හා පළාත්
පාලන වැඩ අංශය,
රත්මලාන.
1968.8.1.

8–523 69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 8, සර්පන්ටයින් පාරේ පිහිටි මුළුතැන්ගෙයි ආහාර ගබඩාවට වර්ග අඩි 1,000 ක ප්‍රමාණයක මැසි නිවාරණ කම්බි දැල් සපයා සවි කිරීම සහ වර්ග අඩි 850 ක ප්‍රමාණයක සුදු පිගන් ගඩොල් සපයා සවි කිරීම සඳහා මිල ගණන් පත්, කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අගෝස්තු මස 23 දින අ. භා. 2.30 දක්වා බාර ගනු ලැබේ.

මිල ගණන් පෝර්ම සහ අනිකුත් විස්තර කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1969 අගෝස්තු මස 23 දින දවල් 12 දක්වා ලබා ගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

මී. ස. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 7. 31 දින, කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8–500—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 8, මැගසින් පාරේ පිහිටි බේකරියට කිතුල් හබල් 150 ක් සාදා සපයා ගෙනැවිත් භාර දීම සඳහා මිල ගණන් පත් කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අගෝස්තු මස 29 දින අ. භා. 2.30 දක්වා භාර ගනු ලැබේ.

මිල ගණන් පත් හා අනිකුත් විස්තර කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1969 අගෝස්තු මස 29 දින දවල් 12 දක්වා ලබා ගැනීමට හැක. මිල ගණන් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

මී. ස. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 7. 31 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8–501—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයට ප්‍රවාහන කටයුතු සඳහා ලොරි රථ කුලියට ලබා ගැනීමට, ලොරි රථ හිමියන් ගෙන් ටෙන්ඩර් ඉල්ලුම්පත්, කොළඹ 1, වැතැම් වීදිය, අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අගෝස්තු මස 29 දින අ. භා. 2.30 දක්වා භාර ගනු ලැබේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක මුදලක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1969 අගෝස්තු මස 29 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක.

වැඩි විස්තර කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගත හැක.

ආර්. ඇජ්. සී. ද ලිවේරා,
අලෙවිකිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 7. 30 දින, කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8–383—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කොළඹ 7, මේට්ලන්ඩ් පෙදෙසේ යෝජිත ජාතික විද්‍යා සභාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම

කොළඹ 7, මේට්ලන්ඩ් පෙදෙසේ යෝජිත ජාතික විද්‍යා සභාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම වස් විද්‍යා පර්යේෂණ හා නිවාස අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් මස 9 වෙනි අඟහරුවාදා පෙරවරු 10 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අතර එදින එකී වේලාවට ටෙන්ඩර්පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර්පත්‍ර ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැකිවාක් මෙන්ම අදාල වෙනත් විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, රජයේ වෙනත් දෙපාර්තමේන්තු, රජයේ සංස්ථා මණ්ඩල සහ මේවායින් එකක ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රු. 7.00.000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර්පත්‍ර ලබාගැනීමට සුදුස්සෝ වෙති. මෙම සුදුසු බවට සහතික යක් සහ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සරප් තැනවෙත, රුපියල් 250 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට 1969 සැප්තැම්බර් මස පස්වෙනි සිකුරාදා දවල් 12 වනතුරු ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඩී. රාජේන්ද්‍රා,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවත,
තැ. පෙ. 544,
කොළඹ 2.
1969 ජූලි 23 දින.

8–441—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් දනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස්ය.

11. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂෙප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමණින්ම රජය කෙරෙහි පවත්නේය.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේය.

13. කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන යම්කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යැයි හැඟී යන කරුණු උඩ කළුතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වය දක්වූ විට කොන්ත්‍රාත්කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුය.

14. කොන්ත්‍රාත්කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනද මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුය. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්ත්වයට අනුව එවකට සහ ඉන්පසු මෙම නිලයෙහි අත්සන් කරන ලද අයද අයත් වේ.

15. මෙයට පෙර භාර ගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල් වේලා ඇතිව ඔවුන් දනට කරගෙන යන වැඩවල තත්ත්වය දක්වෙන, එම වැඩ භරව සිටින පරිපාලන නිලධාරීන් ගෙන් ලබා ගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල් තැන්පත් කොට ගන්නා ලද ලදුපත් සමග කළුතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

16. යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේදී ඇපකරුවන් අවශ්‍ය වුවහොත් තෝරා ගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමේ සමත් විය යුතුය.

17. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවකට අයත් කොන්ත්‍රාත් වැඩ කර තිබෙන කොන්ත්‍රාත්කරුවෙක් වෙතොත් සේවය කොට ඇති දෙපාර්තමේන්තුවේ නම සහ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය.

18. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969.7.26 වැනි දින,
කළුතර කච්චේරියේ දී ය.

8–350/2—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

### මන්නාරම දිස්ත්‍රික්කයේ පාරවල් සෑදීම

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1969 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) පල්ලමඩු සිට පෙරිය මඩු ගොවිජනපදයට පිවිසෙන පාර. (සැ. 1යි).

2. මෙම වැඩ සඳහා 1969 අගෝස්තු මස 17 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් ෆෝර්ම, ටෙන්ඩර් කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද ටෙන්ඩර්කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. එම සමිතිවලින් මෙම ටෙන්ඩර් ෆෝර්ම ඉදිරිපත් කිරීමේදී, ඔවුනට මේ වැඩය කිරීමට අවශ්‍ය මුදල් ඇති බවට, ඔවුනගේ ප්‍රාදේශීය ප්‍රධානීගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. බාහිර ටෙන්ඩර්කරුවන් විසින් ඉල්ලුම් කරන විටදී, ඉල්ලුම්කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලට ද මෙසේ තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය.

3. 1969.8.19 වැනි දින දහවල් 12ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපිකවරයේ "මන්නාරම දිස්ත්‍රික්කයේ පාරවල් සෑදීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට ද පුළුවන. නියමිත දිනයෙහි නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් ගැන සලකා බලනු නොලැබේ.

4. 1969.8.19 වැනි දින පස්වරු 12.20ට ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන්හට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. සතුටුදායක ටෙන්ඩර්කරුවන්හට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් සියයට 2ක් (2%) සතුටුදායක ලෙස නිමකිරීමට ඇප මුදලක් වශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදායක ටෙන්ඩර්කරුවන්ට මෙසේ දනුම් දී දින 10 ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 25 රාජසන්තක කරනු ලැබේ.

6. නියම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනුවක් (90%) වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත 5 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලත් සමග සතුටුදායක අන්දමින් වැඩ නිමකර මාස තුනක් ගතවූ පසු ගෙවනු ලැබේ.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිසාපති.

1969 ජූලි මස 27 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

8–421—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ගලෙන් බිඳුනු වැව මාතෘ නිවාසයට ජල පහසුව සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර ර. වැ. දෙ. ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 සැප්තැම්බර් මස 4 වැනි බ්‍රහස්පතින්දා ප. ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. මරදන්කඩවල රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායඝාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 12,000/- කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 25/- ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වණී 1969 අගෝස්තු මස 22 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10/- බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇම්. ආර්. ප්‍රනාන්දු
අධිකාරී/ඉංජිනේරු.

අනුරාධපුර, ර. වැ. දෙ.
අධිකාරී/ඉංජිනේරු කායඝාලය,
1969.7.27.

8–323—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය.

## රජයේ විදුලිය දෙපාර්තමේන්තුව

### කැළණිතිස්ස ජව පොළෙහි දෙපාර්තමේන්තු නිවාස තැනීම

රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්‍ය කර භාරදීම සඳහා 1969ක් වූ සැප්තැම්බර් 19 සිකුරාදා පූ. භා. 10 දක්වා කොළඹ පාර්සන්ස් පාරේ රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540) විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලිය කියවිලි කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලිය ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙහි දී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයදුම්කරුවන් විසින් රු. 200 මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් සහ සැපයීම් භාර විදුලිය ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. තම ලියාපදිංචිය ඔප්පු කරනු ලැබිය හැකි, රුපියල් හාර ලක්ෂයකට (රු. 4,00,000) නොඅඩු ගොඩනැගිලි වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සුදුස්සන් වන්නෝ ය.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්මවලයි. වර්ෂ 1969ක් වූ සැප්තැම්බර් 16 ද දහවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. වර්ෂ 1969ක් වූ සැප්තැම්බර් මස 19 වන සිකුරාදා පූ. භා. 10ට රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ආර්. අයි. අසීස්,
රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1969 අගෝස්තු 8 දින දීය.

8–382—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## සපත්තු පෙට්ටි සැපයීම සඳහා ටැන්ඩර්

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයීය, ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 අගෝස්තු මස 21 වෙනි දින පෙ. ව. 10 වන තෙක්, 1969/70 මුදල් වර්ෂයට සපත්තු පෙට්ටි සැපයීම සඳහා ටැන්ඩර් පත් භාරගනු ලැබේ.

කැමති අයවලුන්ට රු. 10 ක මුදලක් ටැන්ඩර් පත්‍රිකා ගාස්තු වශයෙන් ගෙවා, ටැන්ඩර් පත්‍රිකා ලබාගත හැක. වැඩි විස්තර පහත අත්සන් තබන අයගෙන් ලබාගත හැක.

සැපයුම් කළමනාකරු.

141, පල්ලිය පාර,
මට්ටක්කුලිය, කොළඹ 15.

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය,

8–493—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ර.වැ.දෙ. අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ-කරවනැල්ල පලමට 46/1, කොළඹ-අවිස්සාවේල්ල-ගිනිගත්හේන පාර. 6″—9″ සක්ක ගල් කියුබ් 75, 2″ කළුගල් කියුබ් 350 සහ 3/4″ කළුගල් කියුබ් 350 ක් සැපයීම හා භාරදීම සඳහා ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ, 1969.8.23 වෙනි සෙනසුරාදා පෙරවරු 11 තෙක් කොළඹ 1, ර. වැ. දෙ. ප්‍රධාන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසිනි.

2. රත්මලානේ ර. වැ. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්‍යාලයෙන් ලබ ගත් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් සියළු විස්තර ලබා ගත හැක.

3. ටෙන්ඩර් පත් නිකුත් කරන්නේ, ටෙන්ඩර් කරුවන් විසින් රු. 200 ක මුදල් තැන්පත් කර, ඒ පිළිබඳ කුවිතාන්සියක් 69.8.15 වෙනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක් වශයෙන් නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊට පසු කුවිතාන්සිය ලබාගෙන ඒ අනුව ප්‍රමාද වූ ඉල්ලුම්කරුවන් විසින් ටෙන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබාගත හැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ර. වැ. දෙ. ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

එස්. නාගලිංගම්,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු වෙනුවට.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්‍යාලය,
ර. වැ. දෙ., රත්මලාන.

8–507—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

| සේවා විස්තර | ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | පිළිගත් මුදල |
|---|---|---|---|
| අළුත් ගෝණි මලු සැපයීම ... | 7 (හතයි) ... | (1) ට්‍රාන්ස් ඕෂන් ආසියා සමාගම, තැ. පෙ. 13, රමනා, ඩැකා, නැ. පකිස්ථානය | ගෝණි 8, 5,000ක් සියයක් පකිස්ථාන් රුපියල් 131.58 බැගින්. |
| | | (2) යුනයිටඩ් ජූට් මිල්ස්, අංක 60, මෝටිජිල්, ඩැකා 2, නැ. පකිස්ථානය | ගෝණි 2,50,000ක් සියයක් පකිස්ථාන් රුපියල් 131.58 බැගින්. |

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1506,
කොළඹ 10,
1969 ජූලි මස 29 වැනි දින.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට

8–489—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1969 ජූනි මාසයේ ටෙන්ඩර් සඳහා අවසාන තීරණ**

| | සේවා විස්තර | ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් ගාස්තුව රු. ශ. |
|---|---|---|---|---|
| 1. | ගැලුම් 4,500 පමණ ධාරිතාව ඇති සුවහනීය පොම්ප 20 සැපයීම | 25 ... | ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරන ලදී. | |
| 2. | ගල් කඩනයක් සැපයීම සඳහා ටෙන්ඩරය ... | 10 ... | කන්ට්‍රැක් ඇන්ඩ් සප්ලයිස් සමාගම, තැ. පෙ. 487, කොළඹ ... | 45,776 50 (අමතර කොටස් සමග) |
| 3. | ගල් රෝලක් සැපයීම සඳහා ටෙන්ඩරය ... | 13 ... | සීමාසහිත හැරිසන්ස් ලිස්ටර් එන්ජිනියරිං, තැ. පෙ. 69, කොළඹ ... | 52,213 76 (අමතර කොටස් සමග) |
| 4. | පහළ ගිරිබාව රෝහලට හා පොලිස් ස්ථානයට යන්ත්‍රාගාරයක් සැපයීමේ ටෙන්ඩරය | 9 ... | සීමාසහිත කොළඹ කොමර්ෂල් සමාගම (ඉංජිනියර්ස්), තැ. පෙ. 1191 කොළඹ | 39,301 7 |
| 5. | මැදිරිගිරියේ රෝහලට යන්ත්‍රාගාරයක් සැපයීම හා සවිකිරීම | 5 ... | සීමාසහිත කේ. එන්. අබ්දුල් කාදර් රවුතර් සහ සමාගම, තැ. පෙ. 872, කොළඹ | 24,833 68 |
| 6. | හෙට්ටිපොල ග්‍රාම්‍ය රෝහලට යන්ත්‍රාගාරයක් සැපයීම හා සවිකිරීම | 5 ... | එම ... | 24,833 68 |
| 7. | පල්ලේගම පොලිස් ස්ථානයට යන්ත්‍රාගාරයක් සැපයීම හා සවිකිරීම | 5 ... | සීමාසහිත හැරිසන්ස් ලිස්ටර් එන්ජිනියරිං, තැ. පෙ. 69, කොළඹ ... | 14,064 12 |
| 8. | පාවිච්චියට නුසුදුසු වාහන විකිණීමේ ටෙන්ඩරය ... | 17 ... | 24 ශ්‍රී 689, ආර්. ඒ. වනිගසිංහ මහත්මා, ''වනිගසිරි'', වැලිගම ... | 13,666 0 |
| | | | 24 ශ්‍රී 744, එච්. පී. පෙරේරා මහතා, මාකුඹුර, පන්නිපිටිය ... | 6,535 0 |
| | | | 24 ශ්‍රී 745, ඇස්. ටිවිත මූර්ති මහතා, 251/20, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 | 6,700 0 |
| | | | 24 ශ්‍රී 746, ඩී. ඩී. පොන්සේකා සහ පුත්‍ර මහතුන්, 28 1/1, ලෝරිස් පෙදෙස, කොළඹ 4 | 10,970 0 |
| | | | 24 ශ්‍රී 747, ආර්. ඒ. වනිගසිංහ මහතා, ''වනිගසිරි'', වැලිගම ... | 10,666 0 |
| | | | 24 ශ්‍රී 779, ඇම්. ඩී. කර්නේලිස් මහතා, තලංගම උතුර, මාලබෙ | 5,199 ^ |

**1969 ජූලි මස—**

තීරණ නැත.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ,
1969 ජූලි මස 26 වැනි දින.

8–491—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**මඩකලපුව දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයේ අප්‍රයෝජනවත් භාණ්ඩ වෙන්දේසියේ විකිණීම**

මඩකලපුව දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයේ ඇති පහත සඳහන් අප්‍රයෝජනවත් ටයර්, ටියුබ් හා බැටරි 1969 අගෝස්තු මස 25 වැනි දින පෙ. ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

| | | |
|---|---|---|
| 600 × 16 | ටයර් | 11 යි |
| 650 × 16 | ටයර් | 4 යි |
| 670 × 15 | ටයර් | 5 යි |
| 700 × 20 | ටයර් | 14 යි |
| 750 × 16 | ටයර් | 18 යි |
| 650—670 × 16 | ටයර් | 4 යි |
| 650—670 × 15 | ටයර් | 2 යි |
| 750 × 16 | ටියුබ් | 12 යි |
| 700 × 20 | ටියුබ් | 10 යි |
| 600 × 16 | ටියුබ් | 23 යි |
| වෝල්ට් 6 | බැටරි | 11 යි |
| වෝල්ට් 12 | බැටරි | 2 යි |

2. මෙම ටයර්, ටියුබ් හා බැටරි වැඩ කරන දිනයන්හි සාමාන්‍ය වැඩ කරන වේලාවන් අතර මඩකලපු දි.කෘ. ව්‍යා.නි. ගේ අවසරය ඇතිව පරීක්ෂා කර බැලිය හැක.

3. ගැනුම්කරු විසින් එවේලේම මුදල් ගෙවා තමන් මිළට ගත් ද එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය. එම දේවල් ඉන් පසු එම ස්ථානයේ තබා ගනු ලබන්නේ ගැනුම්කරු ගේම වගකීම පිටය.

4. දැනුම් දීමක් නොමැතිව මෙම ද්‍රව්‍යයන්ගෙන් ඕනෑම එකක් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය රජය සතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969.7.29 දින,
පේරාදෙනිය.

8–435—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාතමේන්තුව—බස්නාහිර දිසාව

**දව වෙන්දේසිය**

මිල්ල, අළුබෝ, කීන, වැලිපියන්න, බැදිදෙල්, හොර, පෙළෙන්, දුන්, තිනිය, කැකුන හා මලබොඩ යනාදී වර්ගයන්ට අයත් කඳන් ඝන අඩි 1475.8 කින් යුත් කඳන් තොග 16 ක් සහ හොර සිල්පර 3 ක් සහ පිටපලු 475 ක් රත්නපුර දිසා වන නිලධාරි විසින් 69. 8. 21 දින පෙරවරු 10.00 ට කලවාන අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දව වන අපරාධ වලට අයත් දව සහ කෙටි කාල වැඩ ගිවිසුම් වලින් ප්‍රතික්ෂේප කර නාවලකන්ද මාගීසන්න ගබඩාවේ ඇත.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අය ප්‍රථමයෙන් ඒ ඒ ස්ථාන වල ඇති දව බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර රත්නපුර දිසා වන නිලධාරිගෙන් හෝ කලවාන අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දිසා වන නිලධාරී—බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර.
69. 7. 24

8–540—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බටහිර දිසාවේ දැව වෙන්දේසිය

හඳපාන්ගොඩ කුරණ රාජ්‍ය දැව සංස්ථා ගබඩාවේ ඝන අඩි 375.8 යුත් විවිධ ප්‍රමාණයේ බඩදෙල්, මිල්ල හා දුන් කඳන් 27 ක් යුත් දැව තොග හයක් බටහිර දිසාවේ දිසා වන නිලධාරි 1969 අගෝස්තු 24 දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම දැව වෙන්දේසි කිරීමට ප්‍රථම පරීක්ෂා කර බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වැඩි විස්තර බටහිර දිසාවේ දිසා වන නිලධාරිගෙන් හෝ කුරණ රා. දැ. ස. ගබඩාවේ ගබඩා පාලකගෙන් ලබාගත හැකිය.

ඇස්. ඇන්. ශූ. ප්‍රනාන්දු,
බටහිර දිසාවේ දිසා වන නිලධාරි.

දිසා වන කාර්යාලය,
රත්නපුර, 69.7.20.

8–547—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කිරීම්

මඩුරෝඩ් අඩවියේ ඝන අඩි 50.4 යුත් 1 පංතියේ ඉරූ දැව කෑලි 106 සහ ඝන අඩි 113.4 යුත් 1 පංතියේ කඳන් අටක් සහ 1 පංතියේ කනු නවයක් 1969. 8. 25 දින පෙ. ව. 10.00 ට මඩුරෝඩ් අඩවි වන කාර්යාලයේදී වවුනියා දිසා වන නිලධාරී විසින් වෙන්දේසි කරනු ලැබේ.

මිල දී ගැනීමට අපේක්ෂා කරන අයගෙන් මෙම දැව වෙන්දේසි කිරීමට ප්‍රථම දැව පරීක්ෂාකර බලන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මෙහි පහත අත්සන්කර ඇති අය ගෙන් හෝ මඩුරෝඩ් අඩවි වන නිලධාරි තැනගෙන් හෝ ලබාගත හැකිය.

ඇම්. රත්වත්ත,
දිසා වන නිලධාරි—වවුනියාව.

දිසා කැලෑ නිලධාරි කාර්යාලය,
වව්නියාව,
1969. 7. 16.

8–441—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින්, වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ.ව. 9.30ට සිදු කරනු ලැබේ :—

2. උපලේඛනයේ සඳහන් ස්ථානයන්හිදී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දක්වෙන පරිදි මුදලින්ම කළ යුතුය :—

(අ) ඇන්ජිමේ විකුණුම් මිළෙන් ¼ ක් විකිණීම අවසන්වූ වහාම.

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3ක් ඇතුළතදී.

4. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමියෙහිම තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ඩී. 405 | අ. බ. 31 බුක් | ධීවර කාර්යාලය, මාතර | |
| ඩී. 399 | ක්වෙන්ට්රි වික්ටර් | එම | 69.9.14 |
| එජ් 12 | අ.බ. 12 යන්මාර් | එම | |
| ජේපීඑජ් 53 | ඇලිසාග්‍රේග් | ධීවර කාර්යාලය, වෙන්කලාඩි | 69.9.26 |
| ඩී 48 | අ.බ. 8 යන්මාර් | ධීවර කාර්යාලය, මඩකලපුව | 69.9. 7 |
| ඩී. 62 | අ.බ. 8 යන්මාර් | ධීවර කාර්යාලය, කොඩ්ඩවෙලි | |
| එස් 379 | අ.බ. 24 ටෝර්පිඩෝ | එම | |
| ටීඑස් 24 | අ.බ. 12½ ලිස්ටර් | එම | |
| ටීඑස් 61 | ක්වෙන්ට්රි වික්ටර් | එම | 69.9.28 |
| ජේබී 84 | රසියන් | එම | |
| ටීඑස් 57 | ක්වෙන්ට්රි වික්ටර් | එම | |
| කේඑස්එල් 9 | පාර්සන්ස් | එම | |
| ටීඑස් 21 | අ.බ. 12½ ලිස්ටර් | ධීවර කාර්යාලය, පේසාලේ | 69.9.29 |
| ජීඹීබී 15 | අ.බ. 31 බුක් | ධීවර කාර්යාලය, මුතූර් | 69.9.28 |
| ටීකේඑස් 18 | ලිස්ටර් | ප්‍රාදේශීය ධීවර කාර්යාලය, ත්‍රිකුණාමලය | |
| — | ලිස්ටර් සිලි. 2 | එම | |
| — | යන්මාර් සිලි. 1 | එම | |
| — | යන්මාර් සිලි. 1 | එම | |
| — | පාර්සන්ස් සිලි. 1 | එම | 69.9.30 |
| — | පාර්සන්ස් සිලි. 1 | එම | |
| — | බුක් සිලි. 1 | එම | |
| ඩී. 235 | බුක් සිලි. 1 | එම | |
| එම්සී 42 | පයිලට් | එම | |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 ජූලි මස 31 වැනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේදීය.

8–468—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිතවූ/රහිතවූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිතවූ/රහිතවූ ටොන් 3½රේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දිනයන්හිදී සහ ස්ථානයන්හිදී පෙ.ව. 9.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනයෙහි සඳහන් ස්ථානයේදී මෙම යාත්‍රා පරීක්ෂාකර බැලිය හැකිය. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින්ම කළ යුතුය :—

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් ¼ක් විකිණීම අවසන්වූ වහාම.
(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3ක් ඇතුළතදී.

වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යන තෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාගයෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| එස් 189 | — | ගාල්ල වෙළර | 69.9.11 |
| එස් 100 | — | එස්.පී.සී. යාත්‍රාංගනය, කොග්ගල | 69.9.12 |
| එස් 14 | අ.බ. 8 යන්මාර් | මිරිස්ස වෙරළ | |
| එස් 108 | යන්මාර් ... | එම | |
| එස් 63 | — | එම | 69.9.13 |
| එස් 93 | අ.බ. 10 කුබෝටා | එම | |
| එම්සී 52 | යන්මාර් ... | එම | |
| එම්සී 2 | — | මහතොට ගරාජය, මාතර | 69.9.14 |
| ඊ 29 | පාර්සන්ස් ... | දෙවුන්දර වෙරළ | |
| එම්සී 85 | — | එම | 69.9.15 |
| ඊ 36 | අ.බ. 11 පාර්සන්ස් | කවිස්සවැල්ල | |
| එස් 127 | — | ගන්දර වෙරළ | 69 9.16 |
| ඊ 300 | — | කොට්ටෙගොඩ ඔරුවැල්ල | 69.9.17 |
| එස් 142 | — | කංගල්ල වෙරළ | |
| එස් 8 | — | එම | 69.9.19 |
| එස්අයිසී 113 | ටෝර්පිඩෝ ... | හම්බන්තොට වෙරළ | 69.9.20 |
| එස් 219 | — | සුගතදස යාත්‍රාංගනය, මට්ටක්කුලිය | 69.9.20 |
| එස් 298 | — | ලංකා ධීවර සංස්ථාවේ යාත්‍රාංගනය, මට්ටක්කුලිය | |
| එස් 292 | — | එම | |
| එස් 323 | — | එම | |
| එස් 289 | — | එම | |
| එස්අයිසී 63 | — | එම | |
| එස්අයිසී 78 | — | එම | 69.9.21 |
| එස්අයිසී 55 | — | එම | |
| එස්අයිසී 52 | — | එම | |
| එස්අයිසී 51 | — | එම | |
| එස්අයිසී 100 | ටෝර්පිඩෝ ... | එම | |
| එස්අයිසී 58 | — | එම | |
| ජේපීඑස් 11 | — | හැරිසන්ස් ලිස්ටර් යාත්‍රාංගනය, කොම්පඤ්ඤවීදිය | |
| එම්සී 5 | — | එම | 69.9.22 |
| එන්එල් 42 | — | එම්. ජේ. ඩයස් යාත්‍රාංගනය, මට්ටක්කුලිය | |
| එස් 118 | — | එම | 69.9.23 |
| ඊ 371 | — | මෝදර වෙරළ | |
| එස්අයිසී 42 | ටෝර්පිඩෝ (බලොක් එක පමණි) | එම | 69.9.24 |
| ඩීසී 27 ර | — | සිලාවතුරේ | 69.9.19 |
| ටීඑස් 61 | — | සවුත් බාර්, මන්නාරම | 69.9.20 |
| ඩීඩී 12 | අ.බ. 30 පර්කින්ස් | පල්ලිමුනෙයි | 69.9.21 |
| ජේබී 84 | — | වන්කාලයි | 69.9.22 |
| ටීඑස් 21 | — | නාවුකුඩා වෙරළ | 69.9.23 |
| ඊ 86 | ඩයියා ... | කරෙයියූර් ධීවර වරාය | 69.9.11 |
| ඊ 136 | අ.බ. 10 බුක් ... | පවර් ක්‍රාෆ්ට් යාත්‍රාංගනය, යාපනය | 69.9.12 |
| එස් 308 | අ.බ. 24 ටෝර්පිඩෝ | රා. ලං. නාවික භූමිභාගය, ත්‍රිකුණාමලය | 69.9.11 |
| ආර්එස් 9 | අ.බ. 30 පර්කින්ස් | අභ්‍යන්තර වරාය පාර, ත්‍රිකුණාමල | 69.9.12 |
| ඊ. 235 | — | සිලෝන් ෂිප් යාඩ්, වයිනාබෙ | 69.9.13 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 ජූලි මස 31 වැනි දින,
කොළඹ 3, ධීවර දෙපාර්තමේන්තුවේදීය.

8-471—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එෆ්. 1 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු, 1969 අගෝස්තු මස 25 වෙනි දින පෙ.ව. 9.30ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 අගෝස්තු මස 23 වන දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතු ය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. ඒඩී/විකිණීම්/7.
1969 ජූලි මය 23 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

| | | | |
|---|---|---|---|
| 1. ලොරි අමතර කොටස් | ... | පෙට්ටි | 1 යි |
| 2. ස්කූටර් අමතර කොටස් | ... | කාටුන් | 1 යි |
| 3. මෝටර් රථ වාහන දුනුකොළ පෙට්ටි | ... | පෙට්ටි | 1 යි |
| 4. එයාර් ෆිල්ටර්ස් | ... | පෙට්ටි | 1 යි |
| 5. හරිකේන් ලාම්පු | ... | දූසිම | 1 යි |
| 6. පර්පක්ගත් ජාම් | ... | බේල් | 2 යි |
| 7. නයිලෝන් නූල් | ... | ගෝනි | 1 යි |
| 8. පහත සඳහන් ටයර් තොගය | | | |
| 7.50 × 16 ටයර් | ... | | 1 යි |
| 7.10 × 15 ටයර් | ... | | 1 යි |
| 5.60 × 13 ටයර් | ... | | 2 යි |
| 4.00 × 8 ටයර් | ... | | 5 යි |
| 10.05 × 13 ටයර් | ... | | 1 යි |
| 6 × 19 ටයර් | ... | | 1 යි |
| 5 × 17 ටයර් | ... | | 1 යි |

9. පැදුරු ... බේල් 2 යි
10. සායම් ... ඩරම් 4 යි
11. රේයන් නූල් ... කාටූන් 2 යි
12. ඕවල් හෙයිටර්ස් ... ... පෙට්ටි 2 යි
13. ඇන්ගියුලර් අයන් ගයිඩ්ස් ... ... දුසිම් 1 යි
14. වයර් අච්චු ... ... දුසිම් 1 යි
15. ක්ලිනෙක්ස් ටිශිව් ... ... කාටූන්ස් 10 යි
16. කපු නූල් ... ... බේල් 7 යි
17. ග්‍රීස් පොම්ප ... ... පෙට්ටි 1 යි
18. රේයන් නූල් ... ... කාටූන් 1 යි
19. ක්ලිනෙක්ස් ටිශිව් ... ... කාටූන් 29 යි
20. පැදුරු (පන්සලේ පාවිච්චිකරන) ... පෙට්ටි 1 යි
21. බෙලෙක් වරේ ... ... තොගයයි
22. ඇළුමිනියම් ට්‍යුබ් ... ... තොගයයි
23. තේ පෙට්ටි බැඳුම්කර ... ... පෙට්ටි 1 යි
24. තේ පෙට්ටි ... ... තොගයයි
25. වීදුරු තඹලේරු ... ... කාටූන් 9 යි
26. ඉසිනයන් (ස්ප්‍රේයර්ස්) ... ... කාටූන් 6 යි
27. එස්. එම්. ඒ. කිරි පිටි ... ... කාටූන් 1 යි
28. රථවාහන රිම් ... ... 1 යි
29. රේයන් නූල් ... ... කාටූන් 1 යි
30. විවර්ස් හැන්ඩ්ල් ... ... පෙට්ටි 2 යි
31. හිස් පුයර ටින් ... ... කාටූන් 2 යි
32. රටහුණු කූඩු ... ... කාටූන් 1 යි
33. පොරොප්ප තහඩු ... ... තොගයයි
34. වීදුරු තහඩු ... ... පෙට්ටි 2 යි
35. විදුලිමය ෆ්‍යුස් ... ... පෙට්ටි 1 යි
36. ටින්ක්වර සින්ජිබ් ... ... පෙට්ටි 5 යි
37. වැපිරීම් යන්ත්‍ර අමතර කොටස් ... කාටූන් 2 යි
38. ඇලෙන පටි ... ... කාටූන් 9 යි
39. විදුලි බුබුළු ... ... කාටූන් 1 යි
40. අඩින තීන්ත ටින් ... කාටූන් 5 යි
41. කළු ඩයි ... ... ගෝනි 2 යි
42. උළු අච්චු ... ... පෙට්ටි 2 යි
43. චොකලට් ඔතන කඩදසි පෙට්ටි ... 1 යි
44. කොන් ක්‍රිට් ප්‍රෙස් ... ... 1 යි
45. බ්රේක් ලයිනිං ... ... පෙට්ටි 1 යි
46. සොබාවික අවශ්‍යාමය තෙල් ... ... පෙට්ටි 2 යි
47. ස්ටාටිං හැන්ඩ්ල් ... ... පෙට්ටි 1 යි
48. ඇඹරුම් ගල් ... ... පෙට්ටි 1 යි
49. වයර් ... ... රෝල් 4 යි
50. යාන්ත්‍රික අමතර කොටස් ... ... පෙට්ටි 1 යි
51. ඇළුමිනියම් තහඩු ... ... පෙට්ටි 1 යි
52. රිම් ඇතුළත් ට්‍රැක්ටර් ටයර් ... 12 යි
53. ට්‍රැක්ටර් ... ... ටයර් 8 යි
54. මස් ඇඹරුම්කරනයන් ... ... පෙට්ටි 1 යි
55. තඹ තහඩු ... ... රෝල් 2 යි
56. තඹ කම්බි ... ... රෝල් 1 යි
57. බෝල් රේසර් ... ... පෙට්ටි 1 යි
58. බල්බ ... ... පෙට්ටි 1 යි
59. පොත් ... ... පෙට්ටි 5 යි
60. වැපොලින් ... ... බේල් 1 යි
61. ටැල්කම් පව්ඩර් ... තොගයයි
62. අපතේ ගිය නූල් ගෝනි ... ... 2 යි
63. මහන මැෂින් ... ... 2 යි
64. පා පැදි අමතර කොටස් ... ... පෙට්ටි 1 යි
65. ග්‍රීස් ... ... ටින් 1යි
66. හිස් ඩරම් ... ... 2 යි
67. තීන්ත ... ... ඩරම් 7 යි
68. මදින ගල් ... ... පෙට්ටි 3 යි
69. රසායන ද්‍රව්‍ය ... ... පෙට්ටි 1 යි
70. ටර්පන්ටයින් ... ... ඩරම් 1 යි
71. හාවේස් මික්ස්චර් ... ... කාටූන් 1 යි
72. දත් මැදීමට ගන්නා ට්‍යුබ් වල කවර කාටූන් ... 1 යි
73. වීදුරු ප්ලාස්ක්ස් ... ... පෙට්ටි 1 යි
74. ලෙවෙල් කොන්ට්‍රෝල් යන්ත්‍ර ... පෙට්ටි 1 යි
75. වැම්ලින් ටින් ... ... පෙට්ටි 1යි
76. කපාපු කාඩ්බෝඩ් කෑලි ... ... පෙට්ටි 1 යි
77. අත් කන්නාඩි ... ... තොගයයි
78. තීන්ත ... ... පෙට්ටි 1 යි
79. අයිස් ක්‍රීම් වීදුරු ... ... පෙට්ටි 1 යි
80. යාන්ත්‍රික අමතර කොටස් ... ... කාටූන් 1 යි
81. ටින් මූඩි ... ... පෙට්ටි 1 යි
82. කුස්සියේ පාවිච්චියට ගන්නා භාජන තොගයයි
83. ප්ලෑෂ් ලයිට්ස් ... ... කාටූන් 2 යි
84. කපු නූල් හා ඔතන ලද ලනු රෝල් ... ගෝනි 1 යි
85. ඇණ ... ... ගෝනි 1 යි
86. කේබල් ... ... පෙට්ටි 1 යි
87. ඩයි කුඩු ... ... කාටූන් 1 යි
88. සෝඩියම් බයි කාබනේට් ... ... ඩරම් 1 යි
89. තර්මෝස් ප්ලාස්ක් ... ... කාටූන් 3 යි
90. ට්‍රෙයිලර් ටයර් ... ... 1 යි
91. සෙමෝලිනා ... ... කාටූන් 4 යි
92. මැන් කාබන් රෝල් ... ... කාටූන් 1 යි
93. අයන් පැඩිංස් ... ... කාටූන් 1 යි
94. තලාපු හම් ... ... බේල් 3 යි
95. රතු පස් ... ... තොගයයි
96. දූකැති ... ... බේල් 1 යි
97. කැන්වස් ... ... බේල් 1 යි
98. විවිමේ දැල් ... ... පෙට්ටි 1 යි
99. මෝටර් ... ... 1 යි
100. ගල් ලෑලි ... ... තොගයයි
101. ස්පෝට් කිං ... ... ටයර් 15 යි

8–496—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසියේ විකිණීමයි

මෙම උසාවියේ නඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අයිතිවාසිකම් නොකියනු ලබන හා රාජසන්තක කරන ලද ද්‍රව්‍ය තොගයක් 1969 සැප්තැම්බර් මස 2 වෙනි දින පස්වරු 1 ට උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1969.7.30 වෙනි දින,
කුලියාපිටියේ මහෙස්ත්‍රාත් උසාවියේදීය.

ජී. ඇෆ්ප්. එච්. අතුරුපාන,
මහෙස්ත්‍රාත්, කුලියාපිටිය.

8–484—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## රජයේ දැන්වීමයි

1969 ජූනි මස 2 දින ගන්දර වෙරළට ගොඩගැසූ අංක 7237/2 කිව් දරණ " ඔපිමස් " නම් මාලදිවයින් සුළුප්පුව 1969 අගෝස්තු මස 18 දින ප.ව. 1 ට දික්වැල්ලේ වෙරළේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. එහි තිබූ පහත සඳහන් භාණ්ඩ එදින ප.ව. 3.30ට ගන්දර පොලිස් ස්ථානයේ දී වෙන්දේසි කරනු ඇත :—

1. සායම් ටින් 1යි,
2. භූමිතෙල් ගැලොම් 20ක් සහිත බෝයා 3ක් සහ ටින් 3යි,
3. සීසල් තෙල් (ගැලොම් 5½ක් සහිත) බෝයා එකක් සහ ටින් 1යි,
4. ප්ලාස්ටික් බෝයා 3 යි,
5. පනිවටු 1යි,
6. කුඩා හිස් පීප්ප 1යි,
7. කුඩා ලී පෙට්ටි 10ක් සහිත ගෝනි මලු 1යි,
8. හිස් බෝතල් සහිත ගෝනි 1යි,
9. දිග අඩි 10 ටින් ෂීට්ස් 10යි,
10. දිග අඩි 8 ටින් ෂීට්ස් 7යි,
11. ලොකු බේසම් 1 යි,
12. ලෑලි පටි මිටි 1 යි,
13. ලොකු ලී පෙට්ටි 1යි,
14. ඇන්කර් 2 යි.

එච්. බී. වීරරත්න,
අතිරේක දිසාපති,
මාතර දිසාපති වෙනුවට.

1969 ජූලි මස 30 දින,
මාතර දිසාපති කාර්යාලයේදීය.

8–420—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## මැදවච්චිය බලවේග පෙහෙකම්හලේ වෙන්දේසියක්

1967/68 භාණ්ඩ සමීක්ෂණයෙන් විකිණීමට නිර්දේශ කර ඇති පහත සඳහන් දේ 1969 අගෝස්තු මස 22, 23 හා 24 යන දිනයන්හි දිනපතා පෙරවරු 10ටත් පස්වරු 3ටත් අතර මැදවච්චිය බලවේග පෙහෙකම්හලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය ආරම්භ දිනයට දින තුනකට කලින් ගැනුම්කරුවන්ට එම බඩු මැදවච්චිය බලවේග පෙහෙකම් හලේදීම පරීක්ෂා කර බැලිය හැක.

| | | | |
|---|---|---|---|
| (1) පලුදු අමු රෙදි යාර | ... | ... | 5,029 |
| (2) පලුදු 44" × 42½" ඊඩ්ස් | ... | ... | 1 |
| (3) පලුදු 72" × 42½" ඊඩ්ස් | ... | ... | 18 |
| (4) පලුදු 72" × 44" ඊඩ්ස් | ... | ... | 6 |
| (5) ප්ලම් ස්විච් | ... | ... | 10 |
| (6) සයිඩ් ලිවර් | ... | ... | 3 |
| (7) ෂටල් රේස් | ... | ... | 1 |

ජේ. පී. ඒ. පී. ජයසේකර,
කර්මාන්ත සහකාර.

1969 ජූලි මස 24 වෙනි දින,
අනුරාධපුර බලවේග පේෂකර්ම
කාර්යාලයේදීය.

8–340—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

## කැකිරාව බලවේග පෙහෙකම්හලේ වෙන්දේසියක්

1967/68 භාණ්ඩ සමීක්ෂණයෙන් විකිණීමට නිර්දේශ කර ඇති පහත සඳහන් දේ 1969 අගෝස්තු 15, 16, 17 යන දිනයන්හි දිනපතා පෙ. ව. 10 ත් පස්වරු 3 ත් අතර කැකිරාව බලවේග පෙහෙකම්හලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය ආරම්භ දිනයට දින තුනකට කලින් ගැනුම්කරුවන්ට එම බඩු කැකිරාව බලවේග පෙහෙකම්හලේදීම පරීක්ෂා කර බැලිය හැක :—

| | | | |
|---|---|---|---|
| 1. පලුදු කේම්බ්‍රිජ් රෙදි යාර | ... | ... | 6,302 |
| 3. 40ˢ පලුදු නූල් රා. | ... | ... | 50 |
| 3. පලුදු ඊඩ් 72 × 44 | ... | ... | 22 |
| 4. පලුදු ඊඩ් 72 × 42 | ... | ... | 55 |
| 5. පලුදු ඊඩ් 72 × 60 | ... | ... | 2 |
| 6. ෂටල් 13½" ... | ... | ... | 287 |
| 7. බටපොතු පීරි සියුම් 6" | ... | ... | 1 |
| 8. බටපොතු පීරි සියුම් 8" | ... | ... | 1 |
| 9. බටපොතු පීරි තද රළු 8" | ... | ... | 1 |
| 10. පැතලි පීරි 10" ... | ... | ... | 1 |
| 11. පැතලි පීරි සියුම් 12" | ... | ... | 3 |
| 12. තුන් හුලස් පීරි 3/4 5", 6" | ... | ... | 2 |
| 13. තෙල් කෑන් ... | ... | ... | 1 |

ජේ. පී. ඒ. පී. ජයසේකර.
කර්මාන්ත සහකාර.

1969 ජූලි මස 15 වන දින,
අනුරාධපුර,
බලවේග පෙහෙකම් කාර්යාලයේ දීය.

8–349—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1969/70 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද නැවත විකිණීම

අංක 14,861 හා 1969 ජූලි මස 4 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ "කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1969/70 වර්ෂයේ අරක්කු තැබෑරුම් විකිණීම" යන ශීර්ෂය යටතේ මවිසින් පළකරණ ලද සියළුම කොන්දේසිවලට යටත්ව අංක 7 දරණ නාරම්මල අරක්කු තැබෑරුමෙහි රේන්දය නැවත විකිණීම සඳහා 1969 අගෝස්තු මස 21 වැනි දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ජී. බ. දිසානායක,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේදීය.

8–319—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දැන්වීමයි

ගම්පහ අස්ගිරියේ පදිංචි ඩී. ඩබ්ලිව්. සේනානායක වන මම ප්‍රතිඥාත නොතාරිස් ලිපිකරුවෙක් මෙන් ඇතුළත් වී එම තුන් අවුරුදු ශිෂ්‍යසුම අවසන් කළ බවත්, මෙතැන් සිට මාසයක් ඉකුත්වූ පසු නොතාරිස්වරුන් ඇතුළත් කිරීම පිළිබඳ ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ ප්‍රකාර අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරන බවත් සියලු දෙනා වෙත මෙයින් දැනුම් දෙමි.

ඩී. ඩබ්ලිව්. සේනානායක.

1969 ජූලි 28 වෙනි දින,
අස්ගිරියේදීය.

8–411—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නිත්‍යානුගත දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කුවේ පිටිගල් කෝරලේ කටුගම්පල හත්පත්තුවේ මාකඳුරේ පදිංචි හේරත් පතිරන්නැහෙලාගේ පුංචි බණ්ඩා වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1954රේ නොතාරිස් ආඥාපනතේ (සිංහල මුද්‍රණයේ) 7 වෙනි වගන්තිය යටතේ එම පණතේ I උපලේඛනයේ "ආ" කොටසේ 2 වැනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් එළිදරව් කරමි.

මෙයට,
එච්. පී. පී. බණ්ඩා.

8–416—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

### මහරගම නගර සීමාව තුළ අළුතෙන් සාදන ලද නවීන පන්නයේ විශාල ගෙයක් සහ ඉඩම

කොළඹ සී. වී. වැලිකල ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1966.11.1 දින අංක 519 දරන උගස්කරය යටතේ සහ 1968.7.3 සහ 1968.7.18 දිනවල සී. වී. වැලිකල ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 504 සහ 545 දරන දෙවෙනි සහ අතිරේක උගස්කර යටතේ ද මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් ගම්පහ, විජය පාරේ අංක 15/4 නිවසේ පදිංචි කේ. පින්නදූව මහතාගෙන් 1969.3.31 දින තෙක් අයවිය යුතු රු. 25,118.50 අයකර ගැනීම සඳහාත්, එසේම 1969.3.31 දින සිට විකිණීම පැවැත්වෙන දිනය තෙක් හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තව දුරටත් වූ රු. 23,000 ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට 6 ප්‍රමාණ යථෝක්ත උගස්කර ප්‍රකාර 1969.3.31 සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමඟ අයකර ගැනීම සඳහාත්, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන ධනපාල වීරසිංහ මහත්මා විසින් මා වෙත නිකුත් කර තිබෙන බලය ප්‍රකාර වර්ෂ 1969 අගෝස්තු මස 26 දින සවස 4 ට පිහිටි ස්ථානයේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලෙපත්තුවේ මහරගම සුළු නගර සභා සීමාව තුල මහරගම පිහිටි වී. ඒ. එල්. සේනාරත්න බලයලත් මිනින්දෝරුතැන විසින් සකසන ලද අංක 2580 හා 1969.2.1 දින දරණ මානක සැලැස්මේ සඳහන් උතුරින් අංක 75 දරණ කැබැල්ලෙන්ද, නැගෙනහිරින් අංක 76 සහ 77න්ද, දකුණින් අංක 73 දරණ කැබැල්ලෙන් සහ බටහිරින් ඕ දරණ කැබැල්ලෙන්ද (පාරට වෙන්කරන ලද බිම) මායිම් වූ පෙරකී අංක 2580 දරණ සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම හතරක (අක්. 0, රූ. 0, පර්. 20.4) ප්‍රමාණයෙන් යුත් පමුණුව පාරේ වරිපනම් අංක 253/6 දරණ අංක 74 දරණ බෙදා වෙන්කරන ලද කැබැල්ල, ගහකොල, වැවිලි සහ එහි ඇති සියළු දේ සමඟ පෙරකී අංක 2580 දරණ සැලැස්මේ සඳහන් පාරවල්වලට වෙන් කරන ලද "ඒ" සිට "අයි" දක්වා වූ කැබැලි උඩින් පෙරකී අංක 74 දරණ කැබැල්ලට පයින් හා රථවාහනවලින් යාම ඊම සහ එහි එදීම සහ පාරක් ලෙස පාවිච්චි කිරීම, පෙරකී අංක 74 දරණ කැබැල්ල, බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලෙපත්තුවේ මහරගම පිහිටි මහරගම වත්ත නැමැති ඉඩමින් බෙදා වෙන්කරන ලද වී. ඒ. එල්. සේනාරත්න බලයලත් මිනින්දෝරු හා මට්ටම්කරු විසින් සකසන ලද අංක 2484, හා 1962.9.25 දින දරණ මානක සැලැස්මේ සඳහන්, උතුරින් බී දරණ කැබැල්ලෙන්ද, නැගෙනහිරින් පාරෙන් ද, දකුණින් පාරෙන් සහ වී. පී. 184159න් සහ බටහිරින් පාරෙන් සහ ඒ. සී. පෙරේරා සහ තවත් අයට අයිති ඉඩමෙන් ද මායිම් වූ පෙරකී අංක 2484 දරණ සැලැස්ම අනුව අක්කර දොලහක (අක්. 12, රූ. 0, පර්. 0) ප්‍රමාණයෙන් යුත් "ඒ" දරණ බෙදාවෙන් කරන ලට ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසකි.

ඔප්පු පරීක්ෂා කිරීමට කොළඹ 2, සර් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ජාතික නිවාස කොමසාරිස්තැනගෙන් විමසන්න.

ඇම්. වින්සන්ට් පෙරේරා,
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

161/32, අළුත්කඩේ,
කොළඹ 12.
දුරකථන : 28469

8–515—69.8.8 දින අංක 14,866 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 69. 6. 6 සිකුරාද | ... | 69. 5.30 සිකුරාද | දවල් | 12 00 |
| | | 69. 6.13 සිකුරාද | ... | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.20 සිකුරාද | ... | 69. 6.13 සිකුරාද | දවල් | 12 00 |
| | | 69. 6.27 සිකුරාද | ... | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 සිකුරාද | ... | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 සිකුරාද | ... | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 සිකුරාද | ... | 69. 7.11 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 69. 7.25 සිකුරාද | ... | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 සිකුරාද | ... | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 සිකුරාද | ... | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 සිකුරාද | ... | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 සිකුරාද | ... | 69. 8.15 සිකුරාද | ප.ව. | 3 30 |
| | | 69. 8.29 සිකුරාද | ... | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3 30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12 00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12 00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12 00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12 00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි